# ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධයෙන් පවතින සමකාලීන පර්යේෂණ සහ උද්දේශන

Women and Media Collective
Established 1984

Norwegian Embassy
Colombo

**ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධයෙන් පවතින සමකාලීන පර්යේෂණ සහ උද්දේශන**


පළමු මුද්‍රණය: 2021 මැයි
රචනය: පසන් ජයසිංහ
සංස්කරණය: තුෂාරා මනෝජ් සහ රාධිකා ගුණරත්න
පරිවර්තනය: රොෂාන් ද සිල්වා සහ එච්.එන්.ඩී. පෙරේරා

පිටු සැලසුම: ප්‍රියදර්ශනී රාසයියා
සහාය: රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලය

Norwegian Embassy
*Colombo*

ප්‍රකාශක:

Women and Media Collective
Established 1984



**කාන්තා හා මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 08, ශ්‍රී ලංකාව.
විද්‍යුත් තැපැල: wmcsrilanka@womenandmedia.org
වෙබ්: womenandmedia.org
ෆෙස්බුක්: https://www.facebook.com/womenandmediacollective
ට්විටර්:https://twitter.com/womenandmedia

# ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධයෙන් පවතින සමකාලීන පර්යේෂණ සහ උද්දේශන

ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධයෙන් පවතින සමකාලීන පර්යේෂණ සහ උද්දේශන සම්බන්ධයෙන් දළ විශ්ලේශනයක් ලබාදීම මෙම වාර්තාවේ අරමුණයි. මෙහි පළමු කොටස LGBTQI+ උද්දේශන සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. එහිදී දේශීය වශයෙන් සහ අන්තර්ජාතික වශයෙන් සිදුකළ ඇති උද්දේශනයන් සලකා බැලෙන අතර, විවිධ වේදිකාවන්හි ඉස්මතුකර ඇති උද්දේශන කරුණු, ඒ හා සම්බන්ධයෙන් විවිධ ආයතනික මට්ටමින් ඇතිවී තිබෙන ප්‍රතිඵල හා රජය ඒ සම්බන්ධයෙන් සිදුකර ඇති ප්‍රතිචාර විශ්ලේශනය කරනු ලැබේ. මෙහි දෙවැනි කොටස ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ වලට අවධානය යොමු කරයි. එහිදී ශාස්ත්‍රීය සහ ශාස්ත්‍රීය නොවන සහ දේශීය සහ අන්තර්ජතික වශයෙන් සිදුකර ඇති ප්‍රකාශන විශ්ලේශනය කර ඇති අතර අනාගත පර්යේෂණ සඳහා පුළුල් ක්ෂේත්‍ර සහ අංශයන් කිහිපයක් හඳුනා ගැනීමට උත්සහ කර ඇත.

2005 සහ 2015 අතර වසර 15 කාලය තුළ සිදුකර ඇති පර්යේෂණ සහ උද්දේශනයන් මෙම වාර්තාවේ විශ්ලේශනය කරන අතර, ඒ හරහා ශ්‍රී ලංකාව තුළ LGBTQI+ පර්යේෂණ සහ උද්දේශනයන් සම්බන්ධයෙන් සමකාලීන විචාරයක් ලබාදීමට උත්සහ කරයි. 2009 වසර තුළ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුධය නිමාවීම, 2005-2015 කාලය තුළ මහින්ද රාජපක්ෂ රජය සහ 2015-2019 යහපාලන රජය ක්‍රියාත්මක වීම යන කරුණු හේතුවෙන් මෙම කාල පරිච්ඡේදය වැදගත් වේ. දේශපාලන පරිපාලන සන්දර්භය වෙනස්වීම ඇතුළුව මෙම කාල පරිච්ඡේදය තුළ සිදුවූ වර්ධනයන්, LGBTQI+ පර්යේෂණ සහ උද්දේශන වලට සැලකිය යුතු බලපෑමක් සිදු කර ඇත.

# උද්දේශනය

### දේශීය උද්දේශනය

LGBTQI+ සම්බන්ධයෙන් දේශීය වශයෙන් සිදුවන උද්දේශනයන් එක් ක්‍රමවත්, නිල ක්‍රියාවලියක් හරහා සහ අක්‍රමවත්, නිල ක්‍රියාවලීන් දෙකක් හරහා සිදුවී ඇති බව පෙනේ. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ක්‍රමවත්, විධිමත් ක්‍රියාවලිය වන අතර, 2015-2019 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ 2015 ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකාය (CTF) අක්‍රමවත්, විධිමත් ක්‍රියාවලීන් දෙක ලෙස පෙන්වා දිය හැක.

මෙම නිල ක්‍රියාවලීන්ට අමතරව නිල නොවන උද්දේශන ක්‍රියාවලීන් කිහිපයක්ද පවතී. ලේඛනගත කිරීමේ අඩුපාඩු සහ අක්‍රමවත් ස්වභාවය හේතුවෙන් එම නිල නොවන උද්දේශන ක්‍රියාවලි සියල්ල මෙහි දැක්විය නොහැකි අතර, සැලකිය යුතු කිහිපයක් පමණක් සඳහන් කර ඇත.

### මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP)

2011-2016 සඳහා වූ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2010 දී කෙටුම්පත් කරන ලදි. සිවිල් සමාජ සංවිධාන මෙය කෙටුම්පත් කිරීමට තොරතුරු ලබාගැනීමට පැවැත්වූ රැස්වීම සඳහා සහභාගී කරගත්තද, LGBTQI+ සංවිධාන කිසිවකට ඒ සඳහා ආරාධනා කර නොතිබුණි.[1] සිවිල් සමාජ සංවිධාන ඉදිරිපත් කළ පරිදි මෙහි පළමු සහ දෙවන කෙටුම්පත් තුළ සමලිංගිකත්වය නිර්සාපරාධී කිරීමට විධිවිධානයක් ඇතුළත් වුවද, එහි අවසාන කෙටුම්පතින් ප්‍රත්‍යක්ෂ ලෙස එම විධිවිධානය ජනාධිපති රාජපක්ෂ විසින් ඉවත් කර තිබුණි.[2] 2011-2016 කාලය සඳහා වූ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ LGBTQI+ සම්බන්ධයෙන් කිසිඳු විශේෂිත විධිවිධානයක් ඇතුළත් නොවීය.

2016 දී, පැවති රජය මඟින් 2017-2021 කාලය සඳහා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට පුළුල් ක්‍රියාවලියක් ආරම්භ කරන ලදි. ඒ සඳහා කැබිනට් මණ්ඩලය විසින් මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍ය කමිටුවක් පත් කරන ලදි. මෙම කමිටුව විසින් අදාළ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වූ පාලන කමිටුවක් මෙම ක්‍රියාවලිය සඳහා පිහිටවූ අතර එම කමිටුව මඟින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ විවිධ කොටස් කෙටුම්පත් කිරීමට රජයේ ආයතන, සිවිල් සංවිධාන සහ ශාස්ත්‍රීය ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත කෙටුම්පත් කමිටු පිහිටුවන ලදි.[3]

මෙම කමිටු මඟින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ නව ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීම සඳහා මහජන අදහස්/යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරන ලදි. පසුගිය ක්‍රියාවලියට වෙනස්ව, මේ සඳහා ඉදිරිපත් කිරීම් කිහිපයක් සිදුකිරීමට LGBTQI+ සංවිධානවලට හැකි විය. ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස සකස් වූ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ පළමු කෙටුම්පතට ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති අවලංගු කිරීමට සහ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ

---

1 ඊක්වල් ග්‍රවුන්ඩ්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා සමාලෝචනය, 2012 මාර්තු, https://lib.ohchr.org/HRBodies/UPR/Documents/Session14/LK/JS2_UPR_LKA_S14_2012_JointSubmission2_E.pdf, පිටුව 3.

2 සන්ඩේ ටයිම්ස්, "Talk at the Cafe Spectator", සැප්තැම්බර් 11, 2011, http://www.sundaytimes.lk/110911/Columns/cafe.html

3 විදේශ සම්බන්ධතා අමාත්‍යාංශය, මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2017-2021),https://www.mfa.gov.lk/ta/6587-the-national-action-plan-for-the-protection-and-promotion-of-human-rights-2017-2021/

සමාජභාවය පත පදනම්වූ වෙනස්කොට  සැලකීම පැහැදිලිව තහනම් කිරීමට හැකි පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය පුළුල් කිරීමට විධිවිධාන ඇතුළත් විය.[4]

එහෙත් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය විශාල වශයෙන් දේශපාලනීයකරණය වූ අතර, කැබිනට් මණ්ඩලයට යැවීමට පෙර එම කෙටුම්පතේ සමහර විධිවිධාන විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ඉවත් කර ලදි. සමහර කැබිනට් අමාත්‍යවරුන්ගේ දැඩි විරෝධත්වය හේතුවෙන් එම කෙටුම්පතින් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය වෙනස් කිරීමට ඇතුළත් වී තිබූ නිර්දේශය ඉවත් කරන ලදි.[5] කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරනලද මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලසුමට ඉන්පසු කිසිම සිවිල් සමාජ අදහසක් ඇතුළත් නො කරන ලදි.[6]

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් ඇති වගන්තියට ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කිරීමට (ලිංගික දිශානතිය ඇතුළත් නොවිය), පෞද්ගලිකත්වය සම්බන්ධ වගන්ති සමාලෝචනය කර වෙනස් කිරීමට, කෙනෙකුගේ සත්‍ය හෝ පරිකල්පනය කළ ලිංගික දිශානතිය මත සෞඛ්‍ය අංශවල සිදුවන වෙනස්කොට සැලකීම් ඉවත් කිරීමට නිර්දේශ අවසාන මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය.[7] දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති වෙනස් කිරීම යන නිර්දේශය වෙනුවට, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය සමාලෝචනය කර, එය අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්වලට අනුකූල වන පරිදි අවශ්‍ය නීති සම්පාදනය කිරීමට අපැහැදිලි නිර්දේශයක් ඇතුළත් වී ඇත.[8] එලෙස බලන කළ, අවසාන මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අදහස් සහ යෝජනා එක්රැස් කළ සහ කෙටුම්පත් කළ ක්‍රියාවලීන් තුළ ලබා දුන් පොරොන්දුවලින් සම්පූර්ණයෙන්ම වෙනස්වී ඇත.

## *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය*

ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය 2015 දී එවකට සිටි රජය ආරම්භ කරන ලදි. එම ක්‍රියාවලිය මහජන අදහස් විමසීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන නියෝජිත කමිටුව පත්කිරීමෙන් ආරම්භ කරන ලදි. මෙම කමිටුව විසින් ලබා දෙන වාර්තාව මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුවක් විසින් සමාලෝචනය කිරීමට නියමිත වූ අතර, ඒ හරහා ශ්‍රී ලංකාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා යෝජනාවලියක් නව ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුවට ලබා දීමට නියමිතව තිබිණි. එම යෝජනාවලිය සමඟින් අවසාන නව ව්‍යවස්තා කෙටුම්පතක් මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකමිටුව විසින් අනුමත කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මේලනයට ලබා දීමට නියමිතව තිබිණි.[9]

නව ව්‍යවස්ථාවේ සමානාත්මතාවය සහ වෙනස් කොට සැලකීමෙන් තොරවීමේ ඡේදයන් තුළට පැහැදිලිව ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතුළත් කිරීමේ වැදගත්කම ඉස්මතුකරමින් LGBTQI+ සංවිධාන සහ තනිපුද්ගලයින් කිහිපදෙනෙකු ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.[10] ස්වාධීන ආයතනයක් ලෙස 2015 දී ප්‍රතිසංවිධාන ගත කරන ලද ශ්‍රී ලංකා මානව හිමකම් කොමිසම විසින් ද පැහැදිලිව ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පත පදනම් වූ වෙනස්කොට සැලකීම් අවසන් කිරීමට අවශ්‍ය විධිවිධාන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට යෝජනාවලියක් ඉදිරිපත් කරන

---

4 ශ්‍රී ලංකාව සඳහා වන රාජ්‍ය නොවන සංවිධානවල සන්ධානය - ශ්‍රී ලංකාව (SOGI&), 3 වන චක්‍රය සඳහා ඒකාබද්ධ ඉදිරිපත් කිරීම, https://ilga.org/downloads/stakeholders_report_SriLanka_UPR28.pdf, පරිච්ඡේදය 32

5 ශ්‍රී ලංකා සංක්ෂිප්තය, 'ශ්‍රී ලංකාව' ජාතික මානව සම්පත් ක්‍රියාකාරී සැලැස්ම 2016-2021, ක්‍රියාවලියේ සමස්ත ස්වභාවය සහ අඛණ්ඩතාව ප්‍රශ්න කිරීම, 2017 පෙබරවාරි 04, https://srilankabrief.org/2017/02/sri-lanka-national-hr-action-plan-2016-2021-inclusive-nature-and-integrity-of-the-process-questioned

6 ඉහත සඳහන

7 ශ්‍රී ලංකා රජය, මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2017 -2021, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ඡේද 3.1.1, 3.1.2 සහ 6.1.1x ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් 6.6.4 ඡේදය.

8 ඉහත සඳහන, 6.1.8 ඡේදය.

9 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මේලනය, 'ක්‍රියාවලිය'

10 Ground Views,  සමානාත්මතාවය සහ වෙනස් කොට සැලකීම සඳහා අර්ථවත් අයිතියක්, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා ගැනීම, Ground Views, 2016 මාර්තු 28 http://groundviews.org/2016/03/28/a-meaningful-right-to-equality-and-non-discrimination-recognising-sexual-and-gender-identities

ලදි.[11] මෙම සියලු යෝජනා 2016 මැයි මස එළි දක්වන ලද 'ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්' කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලි වාර්තාවේ පැහැදිලිව අන්තර්ගත විය. එම වාර්තාව ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පත පදනම් වූ වෙනස්කොට සැලකීම් පැහැදිලිව තහනම් කිරීම නිර්දේශ කරන ලදි.[12] එමෙන්ම පෞද්ගලිකත්වය සඳහා සම අයිතිවාසිකම්, අදහස් ප්‍රකාශ කිරීමට සහ සංවිධානගත වීමට ඇති නිදහස, පවුල් ජීවිතයට, සාධාරණ නඩු විභාගයන්ට, රැකියා, සමාජ ආරක්ෂණය, සෞඛ්‍ය සහ අධ්‍යාපනයට ඇති අයිතිය LGBTQI+ පුද්ගලයින්ට තහවුරු කිරීමද එම වාර්තාවෙන් නිර්දේශ කර ඇත.[13] වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදුවන (consensual) සමලිංගික ලිංගික හැසිරීම් නිර්සාපරාධී කිරීම සහ පාදඩ ආඥා පනත සංශෝධනය කිරීම ද මෙම වාර්තාව නිර්දේශ කර ඇත.[14]

ඒ අනුව මෙම කමිටුවේ තර්කය වූයේ:

> විශේෂ අයිතීන් නොව, නමුත් නීතිය යටතේ ආරක්ෂාව සඳහා සම අයිතිවාසිකම් සහ වෙනස් කොට සැලකීමෙන් තොර වීම සඳහා සම අයිතිවාසිකම් තහවුරු කිරීමයි.[15]

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලි වාර්තාව සම්බන්ධයෙන් 2016 ජුනි මාසයේදී LGBTQI+ සංවිධාන කිහිපයක් මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුව ඉදිරියේ අදහස් දක්වන ලදි. එවැනි සංවිධානවලට පාර්ලිමේන්තුවේදී කතා කිරීමට ආරාධනා කළ පළමු අවස්ථාව මෙයයි.[16]

අනු කමිටු විසින් 2016 නොවැම්බර් මාසයේදී මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලි වාර්තාවේ ඇති සවිස්තරාත්මක නිර්දේශයන් සියල්ලම පාහේ අතහැර දමා ඇති අතර, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස් කොට සැලකීම පැහැදිලිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් තහනම් කිරීමට ලබා තිබූ නිර්දේශය මෙතුළින් ඉවත් කර ඇති අතර මෙය දරුවන්ට ඇති අයිතියක් ලෙස ව්‍යාප්ත කිරීම සහ සියලූ නීති සම්පාදනය සඳහා පශ්චාත් ප්‍රති අධිකරණ සමාලෝචනයන්ට ඉඩ දීම නිර්දේශ කර ඇත.[17] ඉන්පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දිග්ගැස්සුණු අතර මෙහෙයුම් කමිටුවට සිය අතුරු වාර්තාව ඉදිරිපත් කිරීමට වසරකට වැඩි කාලයක් ගත විය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කෙටුම්පතක් 2019 මුල් භාගයේ දී එළි දක්වන ලදි. එහි අනුකමිටුව විසින් නිර්දේශකර පරිදි, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතා පදනම් කර ගනිමින් වෙනස් කොට සැලකීම් තහනම් කිරීමේ විධිවිධානයක් ඇතුළත් විය.[18] කෙසේවෙතත්, මෙම අවස්ථාව වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඇනහිටි ඇති අතර, එය වත්මන් රජය විසින් නැවත ආරම්භ කරනු ඇතැයි සිතිය නො හැකි ය.

## ***ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකාය***

ජනවාර්ගික ගැටුමෙන් පසුව සංක්‍රාන්ති යුක්තිය සහ සංහිඳියාව සඳහා යෝජිත යාන්ත්‍රණයන් පිළිබඳ මහජන අදහස් එක්රැස් කිරීම සඳහා රජය විසින් 2016 ජනවාරි මාසයේ දී ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකාය පිහිටුවන ලදි. මෙයට LGBTQI+ පුද්ගලයින් සහ සංවිධාන සමූහයක් විසින් පුළුල් ඉදිරිපත් කිරීමක් කරන ලදි.[19]

---

11 ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා, 2017, පි II-III 'http://www.hrcsl.lk/wp-content/uploads/2020/01/Report_to_ESCR_Committee-2017-by-HRCSL.pdf

12 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජනය පිළිබඳ වාර්තාව, 2016 මැයි 10, පි. 95.

13 ඉහත සඳහන පි. 113-4

14 ඉහත සඳහන පි. 114

15 ඉහත සඳහන පි. 112

16 ශ්‍රී ලංකාව සඳහා වන රාජ්‍ය නොවන සංවිධානවල සන්ධානය ශ්‍රී ලංකාව (SOGI*, 3 වන චක්‍රය සඳහා ඒකාබද්ධ ඉදිරිපත් කිරීම යූපීආර් ශ්‍රී ලංකාව සමාලෝචනය, 2017, https://ilga.org/downloads/stakeholders_report_SriLanka_UPR28.pdf, ඡේදය 39

17 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මේලනය, මූලික අයිතිවාසිකම් පිළිබඳ අනු කමිටුවේ වාර්තාව, 2016 නොවැම්බර්, 4, 13 සහ පි 16-7.

18 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මේලනය, 2019 ජනවාරි 11 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මේලනයේදී සභාගත කරන ලද ලේඛන, https://english.constitutionalassembly.lk/media-centre/press-releases/152-documents-tabled-at-the-constitutional-assembly-on-11-january-2019

19 Ground Views, LGBTIQ පුද්ගලයින් සහ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් ඉදිරිපත් කිරීම, Ground Views, 2016 අගෝස්තු 25, http://groundviews.org/2016/08/25/submission-on-lgbtiq-persons-and-transitional-justice-mechanism

2016 අවසානයේ නිකුත් කරන ලද ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකායේ අවසාන වාර්තාව විසින් ඕනෑම සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා LGBTQI+ ප්‍රජාව ඇතුළත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතර LGBTQI+ පුද්ගලයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට විශේෂයෙන් බලපාන කරුණු ඉස්මතු කරන ලදි.[20]

> පත්වීම් ලබා දීමේ ක්‍රියාවලිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්වල යෙදී සිටින අය ඇතුළත් නොවන බවට සහතික කිරීම ඇතුළුව තනතුරු සහ ක්‍රියාවලීන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම යන දෙකෙහිම සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී 'සාම්ප්‍රදයික පවුල' යන වටිනාකම මඟ හැරීම, LGBTQI+ පුද්ගලයින්ගේ අවශ්‍යතා ඇතුළත් කිරීම, එවැනි යාන්ත්‍රණයන් තුළ සේවය කරන නිලධාරීන් විවිධ ස්ත්‍රීපුරුෂ භාවයන් හා ලිංගික දිශානතියන් ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීමක් නොකළ යුතුය.[21]
>
> 'ඥාතීන්' යන වචනය නිර්වචනය කිරීමේදී විවාහක සහකරු හෝ ලේ ඥාතීන් පමණක් අදහස් කිරීම තුළින්, LGBTIQ සහකරුවන් හට සහනයන් (redress) සෙවීම සීමා කරයි. එබැවින් වන්දි ගෙවීමේ දී සාම්ප්‍රදායික 'පවුල' යන අර්ථ දැක්වීමට යටත් වන අයට පමණක් සීමා නොවිය යුතු අතර සාම්ප්‍රදායික නොවන පවුල් ව්‍යුහයන් ද ඇතුළත් විය යුතුය.[22]
>
> LGBTIQ ලෙස හඳුනාගන්නා පුද්ගලයන් හට වෙනස් කොට සැලකීමක් හා සමච්චලයට ලක් කිරීමක් නොවන ආකාරයට වන්දි ගෙවීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට ඉඩ සලසන ක්‍රියාවලියක් තහවුරු කරන ලෙස LGBTIQ පුද්ගලයින්ගේ අවශ්‍යතා නියෝජනය කරමින් ඉදිරිපත් කරන ලද ලිඛිත ඉදිරිපත්කිරීම්වලින් ඉල්ලා ඇත.[23]

ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකා ක්‍රියාවලිය අවසානයේදී රජය විසින් සම්පූර්ණයෙන්ම නොසලකා හරින ලද අතර එහි වාර්තාව එළිදැක්වීමට ජනාධිපතිවරයා සහ අගමැතිවරයා සහභාගී නොවිය. රජයේ ජ්‍යෝෂ්ඨ අමාත්‍යවරු පසුව එම වාර්තාව දැඩිව විවේචනය කරන ලදි.[24] සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩසටහන සහ ක්‍රියාවලිය ඇණහිටීමකට ලක් වූ අතර, පොරොන්දු වූ යාන්ත්‍රණ හතරෙන් එකක් වන අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය පමණක් ස්ථාපිත කරන ලදි. මේ දක්වා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් ජනවාර්ගික ගැටුමෙන් පීඩාවට පත් LGBTIQI+ පුද්ගලයිනගේ ගැටලු සම්බන්ධයෙන් කිසිඳු නිශ්චිත ප්‍රකාශයක් හෝ විධිවිධානයක් සලසා නොමැත. වෙනත් යාන්ත්‍රණයන් හෝ පොදුවේ ඕනෑම සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ වැඩසටහන්, නව රජය යටතේ, ක්‍රියාත්මක වනු ඇතැයි සිතිය නො හැකි ය.

## *HIV සහ AIDS සම්බන්ධයෙන් උද්දේශනය*

HIV/AIDS වැළැක්වීම, ප්‍රතිකාර සහ අධ්‍යාපනය පිළිබඳ උද්දේශනය ශ්‍රී ලංකාවේ LGBTQI+ සංවිධානවල අරමුණක් ලෙස දීර්ඝ කාලයක් පැවතුණු අතර සමීක්ෂණයට ලක් කළ වසර 15 ක කාලය තුළ ද මෙය අඛණ්ඩව අරමුණක් ලෙස පැවතී ඇත. මෙම උද්දේශනය අනෙකුත් උද්දේශන ප්‍රයත්නවලට වඩා වෙනස් වන අතර, සාපේක්ෂව අවම ලෙස දේශපාලනීයකරණය වීම හේතුවෙන් රාජ්‍ය ආයතන විසින් වැඩි වශයෙන් පිළිගැනීමකට ලක් කරයි. ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන HIV සහ AIDS මර්දන සහ ප්‍රතිකාර උපාය මාර්ග සඳහා LGBTQI+ සංවිධාන සමඟ නිරන්තරයෙන් කටයුතු කරයි. විශේෂයෙන්ම නව ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රජාවන් සිතියම් ගත කිරීම සහ නිරීක්ෂණ සමීක්ෂණ සඳහා ගමන් මඟේ සහකරුවෝ හා ඊක්වල් ග්‍රවුන්ඩ් වැනි ආයතන සමඟ ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන කටයුතු කරයි. මෙම වාර්තාවේ

---

[20] ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකාය, ප්‍රතිසන්ධාන යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකායේ අවසන් වාර්තාව, වෙළුම. 1, 17 නොවැ. 2016, පි 55 සහ 89, සහ 354-55

[21] ඉහත සඳහන, ඡේද 207, පි 355

[22] ඉහත සඳහන, ඡේද 88, පි 55

[23] ඉහත සඳහන, ඡේද 242, පි 89

[24] ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම, *Sri Lanka's Transition to Nowhere*, Asia Report, N ° 28" බ්‍රසල්ස් ICG, 2017, https://d2071andvip0wj.cloudfront.net/286-sri-lanka-s-transition-to-nowhere.pdf, පි 16-7

පර්යේෂණ කොටසේ 'HIV' ආශ්‍රිත මැදිහත්වීම් කොටසේ මේවායින් කිහිපයක් ඉස්මතු කර දක්වා ඇත.

මෙම සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ 2018-2022 ජාතික උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා ස්ථාපිත කරන ලද මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින් ලෙස LGBTQI+ සංවිධාන වන පොසිටිව් හෝප්ස් එලායන්ස් සහ යංග් අවුට් හියර් යන සංවිධාන ඇතුළත් විය.[25] මෙහි අවසන් සැලැස්ම පාදඩ ආඥා පනත සහ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන්ගේ HIV සහ ලිංගාශ්‍රිත අසාදන සඳහා පවතින සේවාවන්ට ඇති ප්‍රවේශය දැඩි ලෙස අභියෝගයට ලක් කරන විධිවිධාන ලෙස හඳුනාගෙන ඇත.[26] මෙම සැලැස්ම ජාතික AIDS කවුන්සිලය සහ ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනේ නෛතික හා සදාචාරාත්මක අනු කමිටුව නැවත බලාත්මක කිරීම තුළින් මෙම විධිවිධාන ඉවත් කිරීමට අවශ්‍ය උද්දේශන කටයුතු කිරීමට ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනට නිර්දේශ කරයි.[27] ඒ අනුව ශ්‍රී ලංකාව තුළ වැඩිහිටි අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික ලිංගික ක්‍රියාකාරම් නිර්සාපරාධී කිරීම සඳහා කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහනයි.

### *ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගැනීමේ සහතික ක්‍රියාවලිය*

සංක්‍රාන්ති ලිංගික කාන්තාවන් තිදෙනෙකු ඔවුන්ගේ නීතිමය ස්ත්‍රීපුරුෂ සමාජභාවය වෙනස් කිරීම සඳහා කළ ඉල්ලීම රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පසු 2015 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් LGBTQI+ ක්‍රියාකාරීන් ඇතුළුව සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව ඇතුළු රජයේ පාර්ශවකරුවන් සමඟ නීතිමය ස්ත්‍රීපුරුෂ භාවය හඳුනා ගැනීම පිළිබඳ සංවාද ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.[28] මෙහි ප්‍රතිඵලයක් ලෙස සංක්‍රාන්ති සාමාජභාවී පුද්ගලයින් සඳහා නීතිමය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය (GRC) නිකුත් කිරීම පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය සෞඛ්‍ය සේවා වෘත්තිකයින්ට 2016 දී චක්‍රලේඛනයක් නිකුත් කරන ලදි. පුද්ගලයෙකුගේ නීතිමය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය මත පදනම්ව උප්පැන්න සහතික සහ වෙනත් නිල ලියකියවිලි වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ නම් විස්තර වෙනස් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සමාන්තර චක්‍රලේඛයක් රෙජිස්ට්‍රාර්වරුන්ට සහ වෙනත් අදාළ දෙපාර්තමේන්තු වෙත නිකුත් කරන ලදි.[29]

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයා 'හෝමෝන චිකිත්සාව' සහ 'අවශ්‍ය ශල්‍ය වෛද්‍ය ප්‍රතිකාර' වෙත යොමු කර ඇති බවත් 'පුද්ගලයා ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීමේ ක්‍රියාවලියට භාජනය වී ඇති බවත්' සහතික කරමින් විශේෂඥ මනෝවෛද්‍යවරයකු සහතිකයක් ලබාදීම මෙම නීතිමය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය ලබාගැනීමේ ක්‍රියාවලියේ කොටසකි.[30] අදාළ පුද්ගලයා විසින් 'නියමිත පරිදි සමාජ ස්ත්‍රීපුරුෂ සමාජභාවය වෙනස් කිරීමේ ක්‍රියාවලිය' සම්පූර්ණ කර ඇති බවට මනෝවෛද්‍යවරයා සහතික කළ යුතු ය.[31]

නීතිමය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය ලබාගැනීමේ ක්‍රියාවලිය තුළ අඩුලුහුඩුකම් කිහිපයක් පවතී. මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතියවන, නෛතික ස්ත්‍රී පුරුෂභාවය වෙනස් කිරීම සඳහා වෛද්‍ය, ශල්‍ය හෝ මනෝචිකිත්සක ප්‍රතිකාර හෝ රෝග විනිශ්චය අවශ්‍ය නොවන

---

25 ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන (NSACP), ජාතික HIV/STI ක්‍රමෝපායික සැලැස්ම ශ්‍රී ලංකාව 2018-2022, කොළඹ NSACP, 2017, පි 47 යි.

26 ඉහත සඳහන, පි 22-23

27 ඉහත සඳහන, පි 40

28 ජාතික මානව හිමිකම් ආයතන සහ යූඑන්ඩීපී ආසියා පැසිෆික් සංසදය, ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික ලක්ෂණ සම්බන්ධයෙන් මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම, ජාතික මානව හිමිකම් ආයතන සඳහා අත්පොතක්, 2016, පි. 59.

29 රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, චක්‍රලේඛ අංක 06/2016, 2016 ජුනි 28.
සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය නිකුත් කිරීම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය, සාමාන්‍ය චක්‍රලේඛ අංක 01-34 / 2016, 2016 ජුනි 16.

30 සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය නිකුත් කිරීම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය, සාමාන්‍ය චක්‍රලේඛ අංක 01-34 / 2016, 2016 ජුනි 16.

31 ඉහත සඳහන

බවට ඇති නිර්දේශය,[32] ශ්‍රී ලංකාව තුළ මනෝචිකිත්සක රෝග විනිශ්චය අනිවාර්ය කිරීමෙන් කඩවී ඇත. එමෙන්ම, උප්පැන්න සහතිකවල වෙනස්කම් සිදු කරනු ලබන්නේ පවත්නා සහතික සංශෝධනය කිරීමෙන් මිස නැවුම් සහතික නිකුත් කිරීමෙන් නොවේ. මේ හේතුවෙන්, ශ්‍රී ලංකාවේ උප්පැන්න සහතික මඟින් අවශ්‍ය සෑම අවස්ථාවකදීම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් තවමත් හඳුනා ගැනීමට හැකි වේ. (කෙසේ වෙතත්, ජාතික හැඳුනුම්පත් සහ විදේශ ගමන් බලපත්‍ර වැනි වෙනත් නිල ලේඛන අලුතින් නිකුත් කළ හැකිය). කෙසේ වුවත්, නීතිමය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකය ලබාගැනීමේ ක්‍රියාවලිය පෙර පැවති තත්ත්වයට වඩා යහපත් තත්ත්වයක නිර්මාණය කර ඇත. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකුට තම ස්ත්‍රීපුරුෂ භාවය තහවුරු කිරීමට තවදුරටත් දෙමව්පියන්ගේ කැමැත්ත පිළිබඳ ලිඛිත සාක්ෂි හෝ සායනික රෝග විනිශ්චය තහවුරු කරමින් ශල්‍ය වෛද්‍යවරයකුගේ ලිඛිත සහතිකයක් හෝ ලිංගික අවයව ප්‍රතිනිර්මාණය කිරීමේ සැත්කම් සාක්ෂි ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නොවේ. එමෙන්ම, පුද්ගලයෙකුගේ නෛතික ස්ත්‍රීපුරුෂ භාවය වෙනස් කිරීම තවදුරටත් විවිධ රාජ්‍ය හා සෞඛ්‍ය බලධාරීන්ගේ අභිමතය මත රඳා නො පවතී.

## *ජනතා විමුක්ති පෙරමුණ තුළ උද්දේශනය*

2018 ඔක්තෝබර් 26 වන දින එවකට ජනාධිපතිව සිටි මෛත්‍රීපාල සිරිසේන විසින් එවකට අගමැතිව සිටි රනිල් වික්‍රමසිංහ හදිසියේ ම එම ධුරයෙන් ඉවත් කර හිටපු ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ එම ධුරයට පත් කරන ලද අතර එම ක්‍රියාව රට තුළ ව්‍යවස්ථා අර්බුදයක් ඇති කරන ලදී. ජනාධිපතිවරයා මෙම තීරණය සාධාරණීකරණය කිරීම සඳහා හේතු කිහිපයක් ඉදිරිපත් කරන ලදී. දේශපාලන රැලියකදී ඔහු කියා සිටියේ අගමැතිවරයාගේ 'සමනල' ජීවන රටාවට එකඟ විය නොහැකි බැවින් අගමැතිවරයා එම ධුරයෙන් ඉවත් කළ බවයි. එමෙන්ම රජයේ වැදගත් තීරණ ගෙන ඇත්තේ කැබිනට් මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් නොව මෙම 'සමනල කල්ලිය' බවත් ඔහු ප්‍රකාශ කර සිටියේ ය. 'සමනල' යන යෙදුම සිංහල භාෂාව තුළ LGBTQI+ ප්‍රජාවට නිග්‍රහ කිරීම සඳහා යොදාගන්නා යෙදුමකි. LGBTQI+ ශ්‍රී ලාංකිකයන් සහ සංවිධාන විරෝධතා, මහජන පෙත්සම් නිකුත් කිරීම සහ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම මඟින් මෙම ප්‍රකාශය හෙළා දැකීමට කටයුතු කරන ලදී.[33]

මෙම ප්‍රකාශය පසුබිම් කරගනිමින්, ජනතා විමුක්ති පෙරමුණ ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාවගේ සමාන අයිතිවාසිකම් සඳහා සහයෝගය ප්‍රකාශ කරන ලදි.[34] එමෙන්ම LGBTQI+ ප්‍රජාවේ සාමාජිකයින්ට පුළුල් ප්‍රගතිශීලී සන්ධානයක කොටසක් වීමටද ආරාධනා කරන ලදි.[35] ජනතා විමුක්ති පෙරමුණ විසින් LGBTQI+ ප්‍රජාව සමඟ තම ආර්ථික වය අඛණ්ඩව 2019 වසර තෙක්ම ගෙනගිය අතර, ඒ අතරතුර කාලයේ දී LGBTQI+ ප්‍රජාවට සහයෝගය දක්වමින් විවෘත අදහස් කිහිපයක්ම සිදු කරන ලදි.[36]

මෙහි උච්චතම අවස්ථාවක වූයේ ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් යුත් ජාතික ජන බලය සන්ධානයේ ජනාධිපතිවරණ අපේක්ෂක අනුර කුමාර දිසානායක ඔහුගේ පළමු මහජන රැලියේදී LGBTQI+ ප්‍රජාවගේ සමාන අයිතවාසිකම් සඳහා සහයෝගය යළිත් අවධාරණය කිරීමයි.[37] තවද, ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධයෙන් විශේෂිත කොටසක් ඇතුළත් වී තිබූ අතර එහි දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A සංශෝධනය කිරීම, LGBTQI+ ප්‍රජාවට එරෙහි වෛරී ප්‍රකාශ සහ ප්‍රචණ්ඩත්වය නැවැත්වීම සඳහා නීති පැනවීම සහ LGBTQI+ ප්‍රජාවගේ ආරක්ෂාව සහ

---

32 හියුමන් රයිට්ස් වොච්, 2016, 'ඇඟිලි පහම එක හා සමාන නොවේ' - ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික දිශානතිය යන අනන්‍යතාවයන් මත පදනම් වූ වෙනස් කොට සැලකීම

33 ඩේලි මිරර්, "LGBTQI ප්‍රජාව ජනාධිපති විසින් සිදුකරන ලද 'සමනල ජීවිතය' පිළිබඳ ප්‍රකාශය හෙළා දකී, 2018 නොවැම්බර් 6 වන දින, http://www.dailymirror.lk/article/LGBTQI-community-condemns-Presz-s-remarks-on-butterfly-life--157968.html

34 හියුමන් රයිට්ස් වොච්, 2016, 'ඇඟිලි පහම එක හා සමාන නොවේ' - ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගික දිශානතිය යන අනන්‍යතාවයන් මත පදනම් වූ වෙනස් කොට සැලකීම

35 වරදාස් ත්‍යාගරාජා, 'ජනතා විමුක්ති පෙරමුණ LGBTQI+ පුද්ගලයින් වෙනස් කොට සැලකීමට විරුද්ධව පෙනී සිටී', ඩේලි මිරර්, 2018 නොවැම්බර් 16, http://www.dailymirror.lk/158438/JVP-stands-for-non-discrimination-of-LGBTIQ-persons

36 කොළඹ ටෙලිග්‍රාෆ්, 'පීඩිත LGBTIQ ප්‍රජාවේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීමට ජෙවීපී පොරොන්දු වෙයි', 2019 ජූලි 9,https://www.colombotelegraph.com/index.php/jvp-vows-to-fight-for-the-rights-of-oppressed-lgbtiq-community/

37 ශ්‍රී ලංකා සංක්ෂිප්තය, 'ශ්‍රී ලංකාව - LGBTQ අයිතිවාසිකම්වලට සහාය දෙන බවට ජනාධිපති අපේක්ෂකයෙකුගේ පොරොන්දුව', 2019 සැප්තැම්බර් 21 ,https://srilankabrief.org/2019/09/sri-lanka-a-presidential-candidates-pledge-to-support-lgbtq-rights/

ඔවුන්ගේ දුක්ගැනවිලි විසඳීම සඳහා කැපවූ ලේකම් කාර්යාලයක් පිහිටුවීම ඇතුළත්විය.[38] ජාතික ජන බලය සන්ධානයේ සාමාජික කණ්ඩායම් 18න් එකක් ලෙස LGBTQI+ ක්‍රියාකාරීන්ගෙන් සමන්විතවූ සමහිමානි සාමූහිකය පත් කරන ලදි අතර, ජනතා බලය සන්ධානයේ රැලි කිහිපයකදීම සමහිමානි සාමූහිකයේ සාමාජිකයින් අදහස් ප්‍රකාශ කරන ලදි.[39]

LGBTQI+ ප්‍රජාවට සහයෝගය දැක්වීම සඳහා ජනතා විමුක්ති පෙරමුණ, අනුර දිසානායක සහ ජාතික ජන බලය ලබාදුන් පොරොන්දු සහ ප්‍රතිපත්ති පළමුවරට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂයක් විසින් ලබාදුන් පොරොන්දු සහ ප්‍රතිපත්ති වේ.[40] විශේෂයෙන්ම 2015 වසරේ ජනතා විමුක්ති පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස විසින් LGBTQI+ ප්‍රජාවට විරුද්ධව සිදුකරන ලද ප්‍රකාශ හා සසඳා බැලීමේදී මෙය ජනතා විමුක්ති පෙරමුණේ අදහස්වල සම්පූර්ණ වෙනස් වීමක් පෙන්නුම් කරයි.[41] කෙසේ වෙතත්, දිසානායක ජනාධිපතිවරණයෙන් තුන්වන ස්ථානය ලබා ගනිමින් සියයට 3.16 ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගන්නා ලදි.

LGBTQI+ ගැති ස්ථාවරය ජාතික ජන බලවේගයට ඡන්දදායකයින් ආකර්ෂණය කර ගත්තේ ද නැත්ද යන්න පැහැදිලි නැත. එමෙන්ම, වෙනත් අපේක්ෂකයින්ට සහ දේශපාලන පක්ෂවලට ඔවුන්ගේ අදහස් හෝ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි LGBTQI+ ප්‍රජාවේ සමාන අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාන ස්ථාවරයක් ගැනීමට ද එය බලපෑම් කළ බව නො පෙනේ. ජනාධිපතිවරණයෙන් තේරී පත් වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගෝඨාභය රාජපක්ෂ හෝ දෙවැනි තැනට පත්වූ සමඟි ජන බලවේගයේ සජිත් ප්‍රේමදාස යන දෙදෙනාම ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හි හෝ ප්‍රචාරක කටයුතුවලදී LGBTQI+ ප්‍රජාවට කිසිඳු සහයෝගයක් ප්‍රකාශ කළේ නැත. එසේවුවද, මැතිවරණ ව්‍යාපාරය තුළ LGBTQI+ විරෝධී ප්‍රකාශ ද පළ නො විය.

## ජ්‍යාත්‍යන්තර උද්දේශන

පසුගිය වසර 15 ක කාලය තුළ ජාත්‍යයන්තරව සිදු කරන ලදි LGBTQI+ උද්දේශනයන් කේන්ද්‍රගත වී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම විශ්වීය ආවර්තිතා සමාලෝචනය මත සහ මානව හිමිකම් ගිවිසුම් කමිටු 4ක සමාලෝචන ක්‍රියාවලිය මත ය. මානව අයිතිවාසිකම් කමිටුව; ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව; කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම තුරන් කිරීමේ කමිටුව; සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව. මෙම උද්දේශන උත්සාහයන් සහ සමාලෝචන ආයතනවල හා රජයේ ප්‍රතිචාරවල දී මෙම උද්දේශන උත්සාහයන්වල ප්‍රතිඵල පහත දැක්වේ.

### *විශ්වීය ආවර්තිතා සමාලෝචනය*

මෙම වර්තාව සඳහා තොරතුරු සමීක්ෂණය කරන ලද කාල සීමාව තුළ, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් විශ්වීය ආවර්තිතා සමාලෝචනය ආරම්භ කරන ලද අතර එය තුන් වරක් පවත්වන ලදි. විශ්වීය ආවර්තිතා සමාලෝචන ක්‍රියාවලිය සෑම වසර පහකට වරක් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල මානව හිමිකම් තත්ත්වය සමාලෝචනය කරයි. ඒ සඳහා සමාලෝචනය කරනු ලබන රටවල රාජ්‍ය පාර්ශවය විසින් ඉදිරිපත් කරන වාර්තා, සාමාජික රාජ්‍යයේ පාර්ශවකරුවන්ගේ ඉදිරිපත් කිරීම් සහ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය විසින් සිදු කරන ලද තක්සේරු කිරීම් විශ්ලේශනය කරයි. මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵල ලෙස අදාළ රාජ්‍ය සඳහා නිර්දේශ නිකුත් කිරීම, රාජ්‍ය පාර්ශවයන් ඒවාට ප්‍රතිචාර දැක්වීම සහ ඊළඟ විශ්වීය ආවර්තිතා සමාලෝචනයේ දී සමාලෝචනය කිරීමට හැකි පරිදි කැපවීම් ලබාදීම සිදු වේ.

---

38 ජාතික ජන බලය, ජාතිය සඳහා බලාපොරොත්තුව- ප්‍රතිපත්ති ප්‍රකාශනය, 2019, පි. 50.

39 සුමුදු චාමර , 'එල්ජීබීටී ජනතාව වෙනස් කොට සැලකීම අවසන් කිරීම සඳහා ඡන්දය දිය යුතුය' - වරදාස්, Ceylon Today, 2019 නොවැම්බර් 12, , https://ceylontoday.lk/news-more/8997, ජාතික ජන බලය "LGBTQI - අයිතිවාසිකම් සඳහා සහය දක්වන ඉතිහාසයේ එකම නායකයා NPP අපේක්ෂකයා" තෙනු රන්කෙත්, සමහිමානි සාමූහිකය, 2019 නොවැම්බර් 12, https://www.facebook.com/nppsrilanka/posts/526635057917023

40 ත්‍යාගරාජා , 'ජනතා විමුක්ති පෙරමුණ LGBTQI+ පුද්ගලයින් වෙනස් කොට සැලකීමට විරුද්ධව පෙනී සිටී',

41 අතුල විතානගේ, 'ජනතා විමුක්ති පෙරමුණ එල්ජීබීටී අයිතිවාසිකම්වලට මුළුමනින්ම විරුද්ධයි', ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදීන්, www.jdslanka.org/index.php/news-features/politics-a-current-affairs/578-jvp-in-sri-lanka-totally-opposed-to-lgbt-rights

## *පළමු විශ්වීය ආවර්තිතා සමාලෝචනය*

2008 පැවති පළමු ශ්‍රී ලංකා සමාලෝචනයේදී, ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධ ගැටලු සිවිල් සමාජ ඉදිරිපත් කිරීම් හතරක් මඟින් ඍජුවම ආමන්ත්‍රණය කරන ලදි; ඒ, කාන්තා සහ මාධ්‍ය එකමුතුව විසින්[42], ඊක්වල් ග්‍රවුන්ඩ් විසින්[43], ඉල්ගා යුරෝප්, ඊක්වල් ග්‍රවුන්ඩ්, ජාත්‍යන්තර සමරිසි පිරිමි සහ කාන්තා මානව අයිතිවාසිකම් කොමිසම සහ ARC ඉන්ටනැෂනල් යන එකතුව විසින්[44] සහ ශ්‍රී ලංකාවේ සිවිල් සංවිධාන 29ක එකතුවක් විසිනි.[45]

මෙම ඉදිරිපත් කිරීම් මඟින් ලිංගික දිශානතිය පදනම් කරගෙන රජයේ අනුදැනුම මත සිදුවන වෛරී ප්‍රකාශ, LGBTQI+ අයිතිවාසිකම් වෙනුවෙන් වැඩ කරන මානව හිමිකම් ක්‍රියාකාරීන්ට හිරිහැර කිරීම සඳහා නීති පද්ධතිය භාවිත කිරීම, LGBTQI+ පුද්ගලයින්ට එරෙහිව සිදු කරන ලද අපරාධ සඳහා දඬුවම් නොලැබීම, ප්‍රචණ්ඩත්වය, මරණ තර්ජන සහ ලිංගික දිශානතිය මත පදනම් වූ නීතියට ඔබ්බෙන් වූ මනුෂ්‍ය ඝාතන, LGBTQI+ පුද්ගලයින් කොන් කිරීම සහ පුළුල් ලෙස පීඩා කිරීම වැනි කරුණු ඉස්මතු කර දැක්වීය.[46] මෙම කරුණු එකල පැවති සිවිල් යුද්ධයේ සන්දර්භය තුළ මතුකර ඇති අතර, සිවිල් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස මහජන ආරක්ෂාව පිරිහීම හේතු කොටගෙන ආවේණික සමාජ ආන්තිකකරණය හේතුවෙන් LGBTQI+ පුද්ගලයින් වඩා වැඩි වශයෙන් අවදානමට ලක්වන බව මෙම ඉදිරිපත් කිරීම් තුළින් අවධාරණය කෙරිණි.[47] එමෙන්ම සමාජ-ආර්ථික ක්ෂේත්‍රය තුළ, LGBTQI+ පුද්ගලයන්ට සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සහ රැකියාව සඳහා ප්‍රවේශය සහ සමාජ හා පොදු ජීවිතයට අර්ථවත් ලෙස සහභාගී වීමේ හැකියාව අහිමි වී ඇති බව ඉදිරිපත් කිරීම් මඟින් අවධාරණය කර ඇත.[48]

ඉදිරිපත් කිරීම් සියල්ලම වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික ලිංගික හැසිරීම් නිර්සාපරාධී කිරීම, ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය පදනම් කරගෙන සමානාත්මතාවය සහ වෙනස් කොට සැලකීම තහවුරු කිරීමට ක්‍රියාමාර්ග ගැනීම, සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමට ව්‍යවස්ථාමය අයිතියක් හඳුන්වා දීම යන නිර්දේශ ලබා දී ඇත. පළමු විශ්වීය ආවර්තිතා සමාලෝචනයේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ක්‍රියාකාරී කණ්ඩායමෙන් හෝ අනෙකුත් රටවල්වලින් ශ්‍රී ලංකාව සඳහා කිසිඳු LGBTQI විශේෂිත නිර්දේශයක් ලබා නොදුන් අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට LGBTQI+ ප්‍රජාව සම්බන්ධ ගැටලුවලට කිසිඳු ප්‍රතිචාරයක් දැක්වීම සිදු නොවී ය.

## *දෙවැනි විශ්වීය ආවර්තිතා සමාලෝචනය*

2012 දී පැවති ශ්‍රී ලංකාවේ දෙවන විශ්වීය ආවර්තිතා සමාලෝචනයේදී, ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව සම්බන්ධ ගැටලු සිවිල් සමාජ ඉදිරිපත් කිරීම් තුනක් මඟින් ඍජුවම ආමන්ත්‍රණය කරන ලදි; ඒ, ඊක්වල් ගර්වුන්ඩ් විසින්,[49] ලිංගික අයිතීන් වෙනුවෙන් වූ සන්ධානය විසින්[50], සහ සිවිල් සංවිධාන 29ක් එකතුව විසිනි.[51] LGBTQI+ ප්‍රජාවට සහ එහි සාමාජිකයින්ට එල්ල වන මාධ්‍ය ප්‍රහාරව පැවතිය ද, පළමු විශ්වීය ආවර්තිතා සමාලෝචනයේ සිට රජය විසින් LGBTQI+ ප්‍රජාව මුහුණදෙන ගැටලු සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන නොමැති බව මෙම ඉදිරිපත් කිරීම්වල සඳහන්

---

42 කාන්තා හා මාධ්‍ය සාමූහිකය විසින් ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලදි ඉදිරිපත් කිරීම, 2008, කොළඹ

43 ඊකුවල් ග්‍රවුන්ඩ් විසින් ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලදි ඉදිරිපත් කිරීම, 2008, කොළඹ

44 ඉල්ගා යුරෝප්, ඊකුවල් ග්‍රවුන්ඩ්, ජාත්‍යන්තර සමරිසි පිරිමි සහ කාන්තා මානව අයිතිවාසිකම් කොමිසම සහ ARC ඉන්ටනැෂනල් යත එකතුව ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලදි ඉදිරිපත් කිරීම, බ්‍රසල්ස්, 2008

45 පළමු විශ්ව ආවර්තිතා සමාලෝචනයට ඒකාබද්ධ සිවිල් සමාජ ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකාව, කොළඹ, 2008.

46 ඊකුවල් ග්‍රවුන්ඩ් විසින් ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලද ඉදිරිපත් කිරීම, 2012, කොළඹ - ඉල්ගා යුරෝප්, ඊකුවල් ග්‍රවුන්ඩ්, ජාත්‍යන්තර සමරිසි පිරිමි සහ කාන්තා මානව අයිතිවාසිකම් කොමිසම සහ ARC ඉන්ටනැෂනල් යත එකතුව ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලද ඉදිරිපත් කිරීම, බ්‍රසල්ස්, 2008 ද බලන්න

47 ඉල්ගා යුරෝප්, ඊකුවල් ග්‍රවුන්ඩ්, ජාත්‍යන්තර සමරිසි පිරිමි සහ කාන්තා මානව අයිතිවාසිකම් කොමිසම සහ ARC ඉන්ටනැෂනල් යත එකතුව ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලද ඉදිරිපත් කිරීම, බ්‍රසල්ස්, 2008 ද බලන්න

48 පළමු විශ්ව ආවර්තිතා සමාලෝචනයට ඒකාබද්ධ සිවිල් සමාජ ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකාව, කොළඹ, 2008.

49 ඊකුවල් ග්‍රවුන්ඩ් විසින් ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලද ඉදිරිපත් කිරීම, 2012, කොළඹ

50 ලිංගික අයතීන් වෙනුවෙන් වූ සන්ධානය විසින් ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලද ඉදිරිපත් කිරීම, 2012, කොළඹ

51 පළමු විශ්ව ආවර්තිතා සමාලෝචනයට ඒකාබද්ධ සිවිල් සමාජ ඉදිරිපත් කිරීම - ශ්‍රී ලංකාව, කොළඹ, 2012

විය.[52] ජාතික මානව හිමිකම් යාන්ත්‍රණයන් වන ශ්‍රී ලංකා මනව හිමිකම් කොමිසම සහ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම LGBTQI+ ප්‍රජාව මුහුණදෙන ගැටලු ක්‍රියාශීලී ලෙස සැලකිල්ලට නො ගන්නා බව ද එම ඉදිරිපත් කිරීම් පෙන්වා දෙන ලදි.[53] ඉදිරිපත් කිරීම් මඟින් පළමු විශ්වීය ආවර්තිතා සමාලෝචනයෙන් ලබාදෙන ලද නිර්දේශයන් බොහෝමයක් නැවත ලබා දෙන ලදි.

දෙවන යූපීආර් තුළින් LGBTQI විශේෂිත නිර්දේශ දෙකක් ලබාදෙන ලදි;

1. දණ්ඩ නීති සංග්‍රහයේ 365A වගන්තිය අහෝසි කිරීමෙන් කැමැත්ත ලබාදිය හැකි වයසට ඉහලින් සිටින පුද්ගලයින් අතර සමලිංගික සබඳතා නිර්සාපරාධි කිරීම (කැනඩාව)
2. ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ සියලු වෙනස් කොට සැලකීම් ඉවත් කිරීමේ පියවර ශක්තිමත් කිරීම (ආර්ජන්ටිනාව)

ශ්‍රී ලංකා රජය විසින් මෙම නිර්දේශ දෙකම ප්‍රතික්ෂේප කරන ලදි.

### *තෙවැනි විශ්වීය ආවර්තිතා සමාලෝචනය*

2017 වසරේදී ශ්‍රී ලංකාවේ තුන්වන විශ්වීය ආවර්තිතා සමාලෝචනයේදී ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාවට අදාළ කරුණු සිවිල් සමාජ ඉදිරිපත් කිරීම් සමූහයක් මඟින් සෘජුවම ආමන්ත්‍රණය කරන ලදි. මේ අතරට තනි සහ ඒකාබද්ධ ඉදිරිපත් කිරීම් ඇතුළත් විය.[54] LGBTQI+ සංවිධාන සහ LGBTQI+ ප්‍රජාව සඳහා ක්‍රියාකරන සංවිධාන ඉදිරිපත් කිරීම් ඊක්වල් ග්‍රවුන්ඩ්, යංග් අවුට් හියර්, ග්‍රාස් රූටඩ් සහ කාන්තා සහ මාධ්‍ය එකමුතුව විසින් සිදුකරන ලද අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ද ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි.[55]

මෙම ඉදිරිපත් කිරීම් යළිත් වරක් පෙර පැවති විශ්වීය ආවර්තිතා සමාලෝචනයේ සිට ප්‍රගතියේ ඇති ඌනතාවයට අවධානය යොමුකර තිබූ අතර, 2015 දී සිදු වූ ආණ්ඩු වෙනස් වීමෙන් පසුව ඇති වූ නව සමාජ-දේශපාලන තත්ත්වය, සිවිල් සමාජ ක්‍රියාකාරිත්වයට අවකාශය පුළුල් වීම මෙන්ම LGBTQI+ ගැටලු සඳහා කාර්යක්ෂම ලෙස අවධානය යොමු නො කිරීම සහ LGBTQI+ ප්‍රජාව කෙරෙහි සිදුකරන ලද ඍණාත්මක දේශපාලනික බලපෑමද ඉස්මතු කර තිබුණි.[56] එමෙන්ම ක්‍රියාකාරීන්ගේ විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී ඇතිවන නිලධාරිවාදී ප්‍රමාදයන්, අලුතින් හඳුන්වා දුන් නෛතික ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සහතිකයේ අඩුපාඩු සහ එවකට පැවති ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්බන්ධ කරුණු මෙම ඉදිරිපත් කිරීම් වල ඇතුළත් විය.[57] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික ලිංගික ක්‍රියාකාරකම් නිර්සාපරාධි කිරීමටත්, වෙනස් කොට සැලකීම් විරෝධී විධිවිධාන පුළුල් කිරීමේ අවශ්‍යතාවයටත් මෙම ක්‍රියාවලිය තුළ එකඟ විය.[58]

තෙවන විශ්වීය ආවර්තිතා සමාලෝචනය තුළින් LGBTQI+ ප්‍රජාව සඳහා විශේෂිත නිර්දේශ 9 ක් ඉදිරිපත් කළ අතර රජය විසින් නිර්දේශ තුනක් පිළිගන්නා ලදි.[59]

1. විශේෂයෙන් ජනවර්ගය හා ලිංගික දිශානතිය මත පදනම්වූ සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් වැළැක්වීම (ඉතාලිය).
2. වෙනස් කොට සැලකීම සහ හිංසනය පිළිබඳ විමර්ශනය කිරීම සහ වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන් තහනම් කිරීම තුළින් සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි,

52 ඉහත සඳහන, ඡේද 13(1) හා (2).

53 ඊකුවල් ග්‍රවුන්ඩ් විසින් ශ්‍රී ලංකාවේ විශ්ව ආවර්තිතා වාර්තාවට සිදු කරන ලද ඉදිරිපත් කිරීම, 2012, කොළඹ

54 බලන්න- UNHRC ශ්‍රී ලංකාව පිළිබඳ පාර්ශවකරුවන්ගේ ඉදිරිපත් කිරීම්වල සාරාංශය A/HRC/WG.6/28/LKA/3, 3, 2017 අගෝස්තු 8.

55 HRCSL, කොළඹ, ශ්‍රී ලංකාවේ තුන්වන විශ්ව ආවර්තිතා සමාලෝචනයට HRCSL විසින් ඉදිරිපත් කිරීම.

56 UNHRC, ශ්‍රී ලංකාව පිළිබඳ පාර්ශවකරුවන්ගේ ඉදිරිපත් කිරීම්වල සාරාංශය, 6, 7 සහ 45 ඡේද.

57 ඉහත සඳහන

58 HRCSL, කොළඹ, ශ්‍රී ලංකාවේ තෙවන විශ්ව ආවර්තිතා සමාලෝචනයට HRCSL විසින් ඉදිරිපත් කිරීම, 2017, 35 සහ 36 ඡේද.

59 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, විශ්ව ආවර්තිතා සමාලෝචනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ වාර්තාව - ශ්‍රී ලංකාව, ඒ / එච්ආර්සී / 37/17, 2017 දෙසැම්බර් 29, නිර්දේශ 116.37-39.

සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ මූලික නිදහසට ගරු කිරීම සහතික කිරීම (ආර්ජන්ටිනාව).

3. සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන් ඇතුළු HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන්ගේ විශේෂිත අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතරතුර, HIV/AIDS සන්දර්භය ඇතුළුව, සියලුම සෞඛ්‍ය සේවාවන් තුළ සිදුවන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමට පියවර ගැනීම (පෘතුගාලය).

රජය විසින් නිර්දේශ හයක් සටහන් කරගන්නා ලදි.[60]

4. කැමැත්තෙන් සිදුවන සමලිංගික හැසිරීම් සහ සෙනෙහස විදහා දැක්වීම නිර්සාපරාධී කිරීමට සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ, විශේෂයෙන්ම 365 සහ 365A වගන්ති සංශෝධනය කිරීම (නෙදර්ලන්තය);
5. කැමැත්තෙන් සිදුවන සමලිංගික සබඳතා නිර්සාපරාධී කිරීම සහ සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික ප්‍රජාව මුහුණ දෙන වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට ස්ථිර ක්‍රියාමාර්ග ගැනීම (බ්‍රසීලය);
6. දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති අවලංගු කිරීමෙන් සමලිංගික හැසිරීම නිර්සාපරාධී කිරීම (කැනඩාව);
7. කැමැත්තෙන් සිදුවන සමලිංගික හැසිරීම් සහ සෙනෙහස විදහා දැක්වීම නිර්සාපරාධී කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය, විශේෂයෙන්ම 365 සහ 365A වගන්ති සංශෝධනය කිරීම (ස්වීඩනය);
8. කැමැත්තෙන් සිදුවන සමලිංගික සබඳතා නිර්සාපරාධී කිරීමට දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති වෙනස් කිරීම, සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික ප්‍රජාවට එරෙහිව භාවිත වන ද්වේශ සහගත වචන/යෙදුම් භාවිතය අවම කිරීමට පියවර ගැනීම, පොලිස් නිලධාරීන් විසින් සිදු කරන අපයෝජන හා හිරිහැර වැළැක්වීම (උරුගුවේ);
9. කැමැත්තෙන් සිදුවන සමලිංගික සබඳතා නිර්සාපරාධී කිරීම, ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම සඳහා අවශ්‍ය සියලූ ක්‍රියාමාර්ග ගැනීම, සහ සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික ප්‍රජාවට සෞඛ්‍ය සේවාවන්ට ඇති අයිතිය තහවුරු කිරීම (හොන්ඩුරාස්);

අන්තර්ක්‍රියාකාරී සංවාදයේදී දණ්ඩ නීති සංග්‍රහය වෙනස් කිරීමට රජය කැපවී සිටින බව ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කරන ලද අතර, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය ජාත්‍යයන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීමට රජය කැපවී සිටින බවද ප්‍රකාශ කරන ලදි. එමෙන්ම LGBTQI+ ප්‍රජාවේ පුද්ගලයන්ට වෙනස් ලෙස සැලකීම සඳහා නීතියේ කිසිඳු විධිවිධානයක් යොදා නොගන්නා ලෙසට තහවුරු කිරීමටද කැපවී සිටින බවද දැනුම්දෙන ලදි.[61]

## *මානව හිමිකම් කමිටුව*

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යයන්තර සම්මුතියේ ඇති විධිවිධානවලට සාමාජික රටවල් කොපමණ අයුරකින් අනුකූලවී සිටීද යන්න එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් වරින්වර සමාලෝචනය කරයි. මෙම සමාලෝචන සඳහා සිවිල් සමාජ සංවිධාන විසින් සිදුකරන ඉදිරිපත් කිරීම් මානව හිමිකම් කමිටුව විසින් භාර ගනී.

මෙම කමිටුවට ශ්‍රී ලංකාව සඳහා වන පස්වන වාර්තාව 2014 වසරේ අවසානයේ දී ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. ඊට ප්‍රතිචාර වශයෙන්, සිවිල් සමාජ සංවිධාන විසින් සෙවනැලි වාර්තා (shadow

60 ඉහත සඳහන
61 සන්ඩේ ඔබ්සර්වර්, 'ශ්‍රී ලංකාවේ සමලිංගික භීතිකාවට එරෙහි සටන', 2018 සැප්තැම්බර් 22.

reports) ගණනාවක් ඉදිරිපත් කරන ලද අතර ඊට ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනයේ නායකත්වයෙන් සම්පාදනය කරන ලද ඒකාබද්ද ඉදිරිපත් කිරීමක්,[62] ජාත්‍යන්තර සමරිසි පිරිමි හා කාන්තා මානව හිමිකම් කොමිසම විසින් සිදුකරන ලද ඉදිරිපත් කිරීමක්[63] සහ කලිඩොස්කොප් මානව හිමිකම් පදනම විසින් සිදුකරන ලද ඉදිරිපත් කිරීමක්[64] ඇතුළත් විය.

මෙම ඉදිරිපත් කිරීම් මඟින් වැඩිහිටි අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික ලිංගික හැසිරීම සාපරාධිකරණය කිරීම; පොලිසිය මඟින් සිදුකරන අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම්, අපයෝජන සහ ප්‍රචණ්ඩකාරී හැසිරීම්; ප්‍රකාශන නිදහස මර්දනය කිරීම; වෙනස්කොට සැලකීම්, වෛරී සහගත අපරාධ සහ බලහත්කාරයෙන් සිදුකරන විවාහ වලින් LGBTQI+ පුද්ගලයින් ආරක්ෂා කිරීමට රජයට ඇති නො හැකියාව ඉස්මතු කරන ලදි.

ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාවය පදනම් කරගෙන සිදුවන වෙනස් කොට සැලකීමෙන් සහ කොන්කොට සැලකීමෙන් පුද්ගලයින් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලෙසත්, LGBTQI+ පුද්ගලයින් ව්‍යවස්ථාමය විධිවිධාන මඟින් ආරක්ෂා වී ඇත්ද යන්න පැහැදිලි කරන ලෙසත් මානව හිමිකම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද ගැටලු ලැයිස්තුව හරහා ශ්‍රී ලංකාවට දැනුම් දෙන ලදි.[65] ඊට අමතරව, කමිටුවේ අවසාන නිරීක්ෂණ ලෙස වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂාවීමේ අයිතිවාසිකම් සහතික කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම; ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීම් පහැදිලි ලෙසම නැවැත්වීමට හැකි වන පරිදි ව්‍යවස්ථාව සංශෝධනය කිරීම; LGBTQI+ පුද්ගලයින් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර ශක්තිමත් කිරීම සහ එවැනි අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ පියවර ශක්තිමත් කිරීම නිර්දේශ කර ඇත.[66]

ඊට ප්‍රතිචාර ලෙස 2019 දී ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කළ වාර්තාවෙන් ශ්‍රී ලංකා රජය පෙන්වා දී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තිය යටතේ වෙනස් කොට සැලකීම තහනම් කර ඇති කරුණු එම කරුණුවලට පමණ සීමා නොවන බවත්, ලිංගික දිශානතියේ පදනම මත වෙනස් කොට සැලකීම වක්‍රාකාරයෙන් ඒ හරහා තහනම් වී ඇති බවත් ය. ලිංගික දිශානතිය මත පදනම්ව නීතියේ සමරැකවරණය නැති කිරීම හෝ වෙනස්කොට සැලකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහනම් කර ඇති බවත් ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කරන ලදි.[67] එමෙන්ම ශ්‍රී ලංකා රජය විසින් එවකට පැවති ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විමලසිරිට එදිරිව මරදාන පොලිස් ස්ථානාධිපති සහ නීතිපති සම්බන්ධ නඩුව වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික ලිංගික ක්‍රියාකරකම් සාපරාධිකරණයට විරුද්ධව සිදුවන ධනාත්මක ක්‍රියා ලෙස හුවා දක්වන ලදි.[68]

---

62 ඊක්වල් ග්‍රවුන්ඩ්, ජාත්‍යන්තර මානව හිමිකම් කේන්ද්‍රය - වයඹ විශ්ව විද්‍යාල නීති විද්‍යාලය, මානව අවශ්‍යතා සහ මානව හිමිකම් සඳහා වූ හාර්ට් ලැන්ඩ් සන්ධානයේ. ලිංගිකත්ව සහ මානව හිමිකම් සඳහා වූ ගෝලීය සන්ධානය, ශ්‍රී ලංකාවේ සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිම, සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයින්ට එරෙහිව සිදුවන මානව අයිතිවාසිකම් උල්ලංඝණය වීම්, සෙවනැලි වාර්තාව, දෙසැම්බර් 2013, https://tbinternet.ohchr.org/Treaties/CCPR/Shared Documents/LKA/INT_CCPR_ICO_LKA_15986_E.pdf,

63 ජාත්‍යන්තර සමරිසි පිරිමි හා කාන්තා මානව හිමිකම් කොමිසම, ශ්‍රී ලංකාවේ සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වය, ඔක්තෝම්බර් 2014, https://outrightinternational.org/sites/default/files/SriLanka1014WCover.pdf

64 කලිඩොස්කොප් මානව හිමිකම් පදනම, එල්ජීබීටීඅයි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට සෙවනැලි වාර්තාව (ගැටලු ලැයිස්තුවට ප්‍රතිචාර දැක්වීම), 2014 සැප්තැම්බර්, http://www.kaleidoscopeaustralia.com/wp-content/uploads/2014/09/Sri-Lanka-Report-Final.pdf

65 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව, ශ්‍රී ලංකාවේ පස්වන ආවර්තිතා වාර්තාවට අදාළ ගැටලු ලැයිස්තුව, CCPR/C/LKA/Q/5, 2014 අප්‍රේල් 23, 5 ඡේදය

66 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව, ශ්‍රී ලංකාවේ පස්වන ආවර්තිතා වාර්තාව පිළිබඳ නිරීක්ෂණ අවසන් කිරීම, CCPR/C/LKA/CO/5, 2014 ඔක්තෝබර් 30, 8 ඡේදය

67 ශ්‍රී ලංකාව - ආවර්තිතා වාර්තාව, රාජ්‍ය වාර්තාව, CCPR/C/LKA/6, 2019 පෙබරවාරි 22, ඡේදය 28

68 ඉහත සඳහන, ඡේදය 29 - 30

## *ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව*

ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යයන්තර සම්මුතියේ ඇති විධිවිධානවලට සාමාජික රටවල් කොපමණ අයුරකින් අනුකූල වී සිටී ද යන්න එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව විසින් වරින්වර සමාලෝචනය කරයි. 2017 දී පැවති ශ්‍රී ලංකාවේ පස්වන සමාලෝචනයේදී LGBTQI+ ප්‍රජාව මුහුණපාන ගැටලු ඉස්මතුකරන ලදි.

සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන් වෙනස්කොට සැලකීමට ලක්කරන හෝ වෙනස්කොට සැලකීමට හේතුවන සියලු නෛතික හා නියාමන විධිවිධාන වෙනස්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සහ මෙම ප්‍රජාවන් වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවරයන් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරන ලෙස මෙම කමිටුව විසින් ශ්‍රී ලංකාවට දැනුම් දී ඇත.[69]

ඊක්වල් ග්‍රවුන්ඩ්, ජාත්‍යයන්තර මානව හිමිකම් කේන්ද්‍රය - වයඹ විශ්ව විද්‍යාල නීති විද්‍යාලය, මානව අවශ්‍යතා සහ මානව හිමිකම් සඳහා වූ හාර්ට් ලැන්ඩ් සන්ධානයේ ලිංගිකත්වය සහ මානව හිමිකම් සඳහා වූ ගෝලිය සන්ධානය විසින් මෙයට ඒකාබද්ධ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදි.[70] LGBTIQ පුද්ගලයන්ගේ මානව හිමිකම් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීති අසමත් වන බව; වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂා වීමට LGBTIQ පුද්ගලයින්ට ඇති අයිතිය රැකියා ස්ථානයන්වලදී, නිවාස ලබා ගැනීමේ දී , සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය ලබා ගැනීමේදී සහ විවාහ වීමේදී විවිධ ආකාරයට උල්ලංඝණය වන බව මෙම ඉදිරිපත් කිරීම්වලින් පෙන්වා දෙන ලදි. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය, නිර්සාපරාධිකරණය කිරීම, නෛතික ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා ගැනීමේ ක්‍රියාවලිය, අයිතිවාසිකම් උල්ලංඝණය කරන රාජ්‍ය නිලධාරීන් සහ සමාජ දැනුවත්භාවය පිළිබඳ ප්‍රශ්න එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුවන් විසින් ශ්‍රී ලංකා රජයට ඉදිරිපත් කළ යුතුයැයි මෙම ඉදිරිපත් කිරීම් යෝජනා කරන ලදි.[71]

වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති 12 (2) වගන්තියට ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාවය ඇතුළත් කිරීමට හැකි වන පරිදි පුළුල් කිරීම; සමලිංගික ලිංගික ක්‍රියාකාරකම් නිර්සාපරාධී කිරීම; LGBTQI+ පුද්ගලයන්ට එරෙහිව සිදුවන හිංසනයන් මැඩපැවැත්වීමට සහ වැළැක්වීමට පියවර ගැනීම; සෞඛ්‍ය, අධ්‍යාපනය, රැකියාව සහ නිවාස සඳහා ඔවුන්ට ඇති අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති හැකියාව සහතික කිරීම; සහ LGBTQI+ පුද්ගලයන්ට බලපාන ගැටලු පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ සංවේදී කිරීම සඳහා පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන කරුණු මෙම කමිටුව විසින් අවසාන නිරීක්ෂණ ලබාදීමේදී ශ්‍රී ලංකාවට දැනුම් දී ඇත.[72]

ඊට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා රජය යළිත් වරක් කියා සිටියේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තියේ වෙනස් කොට සැලකීම තහනම් කළ කරුණු එම කරුණුවලට පමණක් සීමා නොවන බවත් ලිංගික දිශානතියට අදාළ වෙනස්කම් ද එම වගන්තියෙන් ආවරණය කළ හැකි බවත් ය.[73] එවකට පැවති ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළින් ලිංගික දිශානතිය වෙනස් කොට සැලකීමකට ලක් නොවන පදනමක් ලෙස නව ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ඇති බවත්; දැනට නීතිය තුළ පවතින වෙනස් කොට සැලකීමේ විධිවිධාන වෙනස් කිරීම සඳහා නීති සම්පාදනය පිළිබඳ අධිකරණ සමාලෝචනයක් අපේක්ෂා කරන බවත්, දණ්ඩ නීති සංග්‍රහය ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුකූලව වෙනස් කිරීමට විධිවිධානයක් 2017-2021 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී

---

69 ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව, පස්වන ආවර්තිතා වාර්තාවට අදාළ ගැටලු ලැයිස්තුව - ශ්‍රී ලංකාව, E/C.12/LKA/Q/5, 2016 නොවැම්බර් 7, 9 වන ඡේදය

70 ඊකුවල් ග්‍රවුන්ඩ්, ජාත්‍යාන්තර මානව හිමිකම් කේන්ද්‍රය - වයඹ විශ්ව විද්‍යාල නීති විද්‍යාලය, මානව අවශ්‍යතා සහ මානව හිමිකම් සඳහා වූ හාර්ට් ලැන්ඩ් සන්ධානයේ . ලිංගිකත්ව සහ මානව හිමිකම් සඳහා වූ ගෝලිය සන්ධානය, ශ්‍රී ලංකාවේ සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිම, සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයින්ට එරෙහිව සිදුවන මානව අයිතිවාසිකම් උල්ලංඝණය වීම්, සෙවනැලි වාර්තාව, අගෝස්තු 2016

71 ඉහත සඳහන

72 එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව, ශ්‍රී ලංකාවේ පස්වන ආවර්තිතා වාර්තාව පිළිබඳ නිරීක්ෂණ අවසන් කිරීම, E/C.12/LKA/CO/5, 2016 නොවැම්බර් 7, 17 සහ 18 ඡේද

73 ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකාවේ පස්වන ආවර්තිතා වාර්තාවට අදාළ ගැටලු ලැයිස්තුව - ගැටලු ලැයිස්තුවට ශ්‍රී ලංකාවේ පිළිතුරු, E/C.12/LKA/Q/5/Add.1, 11 අගෝස්තු 2017, ඡේද 52-55.

සැලැස්මේ ඇතුළත් වී ඇති බවත් රජය ප්‍රකාශ කරන ලදි.[74] නමුත්, 2017-2021 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙන් 365 සහ 365A වගන්ති වෙනස් කිරීම පිළිබඳ විධිවිධාන රජය විසින් ඉවත් කර තිබුණි.

### *කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම තුරන් කිරීමේ කමිටුව*

කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතියේ විධිවිධානවලට සාමාජික රටවල් කොපමණ අයුරකින් අනුකූලවී සිටීද යන්න කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම තුරන් කිරීමේ කමිටුව වරින්වර සමාලෝචනය කරයි. සිය සාමාජික රාජ්‍යවල සමාලෝචනයන්වලදි සිවිල් සමාජ සංවිධානවලින් සිදු කරන ඉදිරිපත් කිරීම්වලට මෙම කමිටුව ආරාධනා කරයි. 2011 දී ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ පස්වන, හයවන සහ හත්වන වාර්තා සහ 2017 දී ඉදිරිපත් කරන ලද අටවන වාර්තාවන් වල ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාවට බලපාන ගැටලු ඉස්මතු කර තිබිණි.

ශ්‍රී ලංකා සිවිල් සමාජ සංවිධාන 61 ක් වෙනුවෙන් කාන්තා හා මාධ්‍ය සාමූහිකය විසින් ඉදිරිපත් කරන ලද රාජ්‍ය නොවන සංවිධාන සෙවනැලි වාර්තාවේ සඳහන් කර තිබුනේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තියට සමලිංගික ආර්ථික ඇතුළත් වීමට නම් දණ්ඩ නීති සංග්‍රහය සමාලෝචන කිරීම සහ සමලිංගික ලිංගික ක්‍රියාකාරකම් නිර්සාපරාධි කිරීම අවශ්‍ය වන බවයි.[75] එමෙන්ම පාදඩ ආඥා පනත සහ ගණිකා නිවාස ආඥා පනත ද විශාල ලෙස වෙනස් විය යුතු බවද මෙම ඉදිරිපත් කිරීම පෙන්වා දෙන ලදි.[76] ශ්‍රී ලංකාවේ සමරිසි, ද්විරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන්ගේ තත්ත්වයයන් පිළිබඳ විශේෂ අවධානයක් කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලදි සෙවනැලි වාර්තාවේ ඇතුළත්විය.[77]

2011 වසරේ කමිටුවේ අවසාන නිරීක්ෂණවලදි සමලිංගික ආර්ථික සාපරාධිකරණය කිරීමෙන් කාන්තාවන් සම්පූර්ණයෙන්ම නීතිමය රැකවරණයෙන් බැහැර කර තිබෙන බව ප්‍රකාශ කළ කමිටුව වැඩිහිටියන් අතර සමලිංගික ලිංගික ආර්ථික නිර්සාපරාධී කිරීමට පියවර ගන්නා ලෙසත් සම්මුතියේ ඇති වෙනස්කොට සැලකීමෙන් තොරවීම යන විධිවිධානයට අනුකූල වන ලෙසත් රජයට නිර්දේශ කරන ලදි.[78] 2015 දී මීට ප්‍රතිචාර දක්වමින් දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්ති, ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂා වීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය යටතේ ඇති ව්‍යවස්ථාමය සහතිකයට විරුද්ධ නොවන බව ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කර සිටියේය.[79]

2017 වර්ෂයේ සමාලෝචන ක්‍රියාවලිය සඳහා, කාන්තා හා මාධ්‍ය සාමූහිකය විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නොසලකා හැර සමලිංගික ලිංගික ආර්ථික නිර්සාපරාධී කිරීමටත් වෙනස් කොට සැලකීමෙන් අරක්ෂාවීමටත් අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කරන ලෙස නිර්දේශ කර තිබුණි.[80] කලිඩෝස්කෝප් මානව හිමිකම් පදනම සහ ඊක්වල් ග්‍රවුන්ඩ් විසින් ඒකාබද්ධව සිදුකරන ලද ඉදිරිපත් කිරීම හරහා නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කළ අතර ඊට සමලිංගික ලිංගික ආර්ථික නිර්සාපරාධී කිරීමට හා වෙනස් කොට සැලකීමෙන් අරක්ෂා කිරීම; සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් හට තම නෛතික ස්ත්‍රීපුරුෂ සමාජභාවය වෙනස්කිරීම උදෙසා තම ලිංගික අවයව පිළිබඳ සහතික කිරිමේ පූර්ව අවශ්‍යතාවය, නෛතික ස්ත්‍රීපුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතික ලබාදීමේ ක්‍රියාවලියෙන් ඉවත්කිරීම; ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන

---

74 ඉහත සඳහන, ඡේද 51

75 ශ්‍රී ලංකා සෙවනැලි වාර්තාව - කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ කමිටුවල කාන්තා හා මාධ්‍ය සාමූහික, , පිටුව 34.

76 ඉහත සඳහන, පි 36-7

77 කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම, ශ්‍රී ලංකාවේ සමරිසි, ද්විරිසි සහ සංක්‍රාන්ති සමජභාවී කාන්තාවන්ගේ තත්ත්වය, රාජ්‍ය නොවන සංවිධාන සෙවනැලි වාර්තාව, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ කමිටුව, 2011 ජනවාරි, 2011, http://www2.ohchr.org/english/bodies/cedaw/docs/ngos/WSG_SriLanka48.pdf

78 කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ කමිටුව, නිරීක්ෂණ අවසන් කිරීම, CEDAW/C/LKA/CO/7, 2011 අප්‍රේල් 8, 25 (g) ඡේදය.

79 කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ කමිටුව, 2015 දී ලැබීමට නියමිත රාජ්‍ය පක්ෂයේ අටවන වාර්තාව - රාජ්‍ය පක්ෂයේ වාර්තාව, ශ්‍රී ලංකාව, CEDAW/C/LKA/8, 2015 මැයි 29, 36 ඡේදය.

80 කාන්තා හා මාධ්‍ය සාමූහික, ශ්‍රී ලංකා සෙවනැලි වාර්තාව, කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුවට (CEDAW), 2017 ජනවාරි, පි. 11.

LGBTI පුද්ගලයින්ට සමාජ ආර්ථික සමානාත්මතාවය සහ ආරක්ෂණය තහවුරු කිරීම; සමරිසි විවාහ; සහ LGBTI පුද්ගලයන්ට දරුවන් දරුකමට හදා ගැනීමට ඉඩ දීම ඇතුළත් විය.[81]

2017 දී කමිටුවේ අවසාන නිරීක්ෂණවලදී, නව ව්‍යවස්ථාවට වෙනස් කොට සැලකීම සඳහා තහනම් කරුණක් ලෙස ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ඇතුළත් කිරීම; ලිංගික සුළුතර ප්‍රජාවන්ට අයිති කාන්තාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය ළඟා කර ගැනීම සඳහා තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග ගැනීම; සහ පාදඩ ආඥා පනත අවලංගු කිරීම යන නිර්දේශ ලබා දෙන ලදි. ඊට ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකාවට තවම අවස්ථාවක් ලැබී නැත.[82]

## *ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව*

ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ විධිවිධානවලට සාමාජික රටවල් කොපමණ අයුරකින් අනුකූලවී සිටීද යන්න ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව වරින්වර සමාලෝචනය කරයි. සිය සාමාජික රටවල සමාලෝචනයන්වලදී සිවිල් සමාජ සංවිධානවලින් සිදු කරන ඉදිරිපත් කිරීම්වලට මෙම කමිටුව ආරාධනා කරයි. 2018 දී ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ පස්වන සහ හයවන වාර්තාවල ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාවට බලපාන ගැටලු ඉස්මතු කර තිබිණි.

ඊක්වල් ග්‍රවුන්ඩ් සිදුකළ ඉදිරිපත් කිරීමකින් දක්වා තිබුණේ ශ්‍රී ලංකාව තුළ ලිංගික දිශානතිය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම්ව දරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වන බවත් මෙය විසඳීමට ව්‍යවස්ථාදායක හා අධ්‍යාපන අංශ දැනුවත් කිරීම අවශ්‍ය බවත් ය.[83] සෑම තැනකම පරිසරය හා ළමුන් ආරක්ෂා කිරීමේ සංවිධානය සහ ECPAT ඉන්ටර්නැෂනල් විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීමකින් සඳහන් කර තිබුනේ සමලිංගික ලිංගික හැසිරීම සාපරාධීකරණය තුළින් දරුවන් පැහැදිලි ලෙස එම ක්‍රියාවෙන් ආරක්ෂා නොකරන නිසා එයින් දරුවන් අනතුරට පත්විය හැකි බවයි. මේ අනුව, අපයෝජන අවස්ථාවන්හිදී  දරුවෙකු වරදකරුවෙකු ලෙස සැලකෙන අතර වින්දිතයෙකු ලෙස හඳුනා නොගන්නා බව ඉන් පැහැදිලි කර තිබුණි.[84] ඕල් සවයිවර්ස්  ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද ඉදිරිපත් කිරීමක දක්වා ඇත්තේ LGBTI පුද්ගලයින් ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් පවතින සම්මතයන්ට අභියෝග කිරීමට උත්සහ කරන නිසා ලිංගික හිංසනයන්ට ගොදුරු වීමට ඉඩකඩ ඇති බවයි.[85]

කමිටුවේ අවසාන නිරීක්ෂණවලදී සම්මුතියේ වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් ඇති විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකාව විසින් සමරිසි කාන්තා හා පිරිමි, ද්විරිසි කාන්තා හා පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී දරුවන් ඇතුළු ආන්තික හෝ අවදානමට ලක්වී ඇති දරුවන් වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාශීලී හා පුළුල් උපාය මාර්ගයවලින් සමන්විත නිශ්චිත සහ හොඳින් ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව මෙම කමිටුව ශ්‍රී ලංකාවට නිර්දේශ ලබා දෙන ලදි.[86] එමෙන්ම LGBTI දරුවන් මුහුණ දෙන වෙනස් කොට සැලකීම මැඩපැවැත්වීම සඳහා සමලිංගික ලිංගික සම්බන්ධතා නිර්සාපරාධී කිරීම, සංක්‍රාන්ති සමාජභාවී දරුවන්ට නීතිය ක්‍රියාත්මක කරන්නන් විසින් සිදුකරන හිරිහැර කිරීම තහනම් කිරීම, LGBTI දරුවන්ට ලිංගික අතවර ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා කරන්නන් නීතිය හමුවට ගෙන ඒම ද නිර්දේශ ලෙස ඉදිරිපත් කරන ලදි.[87]

81 ඊකුවල් ග්‍රවුන්ඩ්, ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික දිශානතියන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවන් ඇති දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වාර්තාව, 2017 පෙබරවාරි

82 කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම තුරන් කිරීමේ සම්මුතිය පිළිබඳ කමිටුව, ශ්‍රී ලංකාවේ හත්වන ආවර්තිතා වාර්තාව, CEDAW/C/LKA/CO/8, 2017 මාර්තු 9, ඡේද 11, 21, 27 (g)

83 ඊකුවල් ග්‍රවුන්ඩ් , 2 ශ්‍රී ලංකාවේ විවිධ ලිංගික දිශානතියන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී  දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වාර්තාව, 017 පෙබරවාරි

84 සෑම තැනකම පරිසරය හා ළමුන් ආරක්ෂා කිරීම සහ ECPAT International, විකල්ප වාර්තාව, 2017 පෙබරවාරි 28, . ඡේද 11.

85 ඕල් සවයිවර්ස්  ව්‍යාපෘතිය , ශ්‍රී ලංකාවේ සහ බොස්නියාවේ සහ හර්සගොවිනා හි පිරිමි සහ පිරිමි ළමයින්ට එරෙහි ලිංගික හිංසනය, 2017, පි. 17.

86 ළමා අයිතිවාසිකම් පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ පස්වන හා හයවන ආවර්තිතා වාර්තා පිළිබඳ නිරීක්ෂණ අවසන් කිරීම, CRC/C/LKA/CO/5-6, 2018 පෙබරවාරි 2,

87 ඉහත සඳහන, ඡේද 16(c)

ශ්‍රී ලංකාව තුළ පිරිමි දූෂණයන් නෛතිකව හඳුනා නොගැනීම, අපකීර්තිමත් ස්වභාවය, සමලිංගික ලිංගික ක්‍රියාවන් සාපරාධීකරණය කර තිබීම සහ, පිරිමිකම නැතිවීම සම්බන්ධයෙන් ඇති ලැජ්ජාව නිසා පිරිමි ළමයින් මුහුණපාන ලිංගික හිංසනයන් අඩු වශයෙන් වාර්තා වීම කමිටුව නිරීක්ෂණය කරන ලදි.[88]

ළමයින්ට සිදුවන ලිංගික අපයෝජන හා සූරාකෑම වැළැක්වීම සඳහා ඵලදායි හා පුළුල් ප්‍රතිපත්තියක් සකස් කිරීම, පිරිමි ළමයින් ව්‍යවස්ථාපිත ලෙස දූෂණය කිරීම අපරාධකරණය කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය සංශෝධනය කිරීමට කඩිනම් පියවර ගැනීම, පිරිමි ළමයින් දූෂණය වීම පිළිබඳ වාර්තා කිරීම දිරිගැන්වීම සඳහා මහා පරිමාණ දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම, ඒ හා සම්බන්ධව ඇති අපකීර්තිමත් භාවය ඉවත් කිරීමට පියවර ගැනීම සහ එවැනි ප්‍රචණ්ඩත්වයන් වාර්තා කිරීමට ප්‍රවේශ විය හැකි, රහස්‍ය, ළමා-හිතකාමී සහ ඵලදායී වාර්තාකරණ ක්‍රමවේද සකස් කිරීම යන නිර්දේශ කමිටුව විසින් ශ්‍රී ලංකාවට ලබාදෙන ලදි.[89] මේ සඳහා ශ්‍රී ලංකාව තවමත් ප්‍රතිචාර දක්වා නොමැත.

### *දේශීය සහ අන්තර්ජාතික LGBTQI+ උද්දේශණය සම්බන්ධයෙන් පසුබිපරම*

මෙම සමීක්ෂණය සඳහා සලකා බලන ලද කාල සීමාව තුළ LGBTQI+ ගැටලු සම්බන්ධයෙන් ක්‍රියාකළ සංවිධාන ගණනාවක් උද්දේශන ක්‍රියාවල නිරත වුණු බව දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දේශීය හා ජාත්‍යයන්තර වශයෙන් සිදුවන නිල හා විධිමත් ක්‍රියාවලීන්හිදී LGBTQI+ ගැටලු නිරන්තරයෙන් සඳහන් වේ. තවද, LGBTQI+ උද්දේශන උත්සාහයන්වල නිර්සාපරාධීකරණය සහ වෙනස්කොට සැලකීමෙන් තොරවීම මූලික කරුණු ලෙස පැවතියද, මානව හිමිකම් රාමුව සහ කතිකාව මත පදනම් වූ අනෙකුත් කරුණු විශාල ප්‍රමාණයක්ද මතු වී ඇත.

සමීක්ෂණයට සලකා බලන ලද කාල සීමාව ඇතුළත LGBTQI+ ගැටලුවලට ප්‍රතිචාර දැක්වීමේ ශ්‍රී ලංකා රජයේ උපායමාර්ගවල යම් යම් වෙනස්කම් සිදුවී ඇති බව දක්නට ලැබේ. දේශීය ව, මහින්ද රාජපක්ෂ/එක්සත් ජනතා නිදහස් සන්ධාන පරිපාලනය LGBTQI+ උද්දේශන සම්බන්ධයෙන් උදාසීන ස්ථාවරයක් පවත්වා ගෙන ගියත් එම කාලය ඇතුළත LGBTQI+ ප්‍රජාවට එරෙහි හිංසනය සහ වෙනස් කොට සැලකීම එම පරිපාලනය විසින් පවත්වාගෙන යන ලදි. අන්තර්ජාතික වශයෙන්, LGBTQI+ ප්‍රජාවට එරෙහිව සිදුවන වෙනස් කොට සැලකීම තහනම් කිරීම 12 වන වගන්තිය යටතේ ව්‍යවස්ථානුකූලව සලකා බැලිය හැකි බවට ඉතා ලුහුඬු අවධාරණයක් කරන ලදි. ඊට අමතරව, LGBTQI+ ප්‍රජාව පිළිගැනීමට හෝ එම ප්‍රජාව මුහුණ දෙන ගැටලු සලකා බැලීමට සැලකිය යුතු උත්සාහයක් නො තිබුණි.

2015 දී සිදු වූ ආණ්ඩු වෙනස්වීමත් සමඟ දේශීය ව සිදු කරන ලද LGBTQI+ උද්දේශනයන් සඳහා වැඩි අවස්ථාවක් ලැබුණු අතර ජාත්‍යයන්තරව එම ගැටලු සඳහා වැඩි පිළිගැනීමක් රජය විසින් ලබා දෙන ලදි. ඇතැම් දේශීය ක්‍රියාවලීන් LGBTQI+ ප්‍රජාව සහ එහි ගැටලු හඳුනාගැනීම සඳහා ගත් උත්සහයන් පිළිගත යුතු ය. නමුත් නැවත සලකා බැලීමේදී ඒවා හුදෙක් LGBTQI+ ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනා ගැනීමට ගත් උත්සාහයන් පනමක් වන අතර එම ගැටලු විසඳීමට කිසිඳු අර්ථවත් හෝ දේශපාලන කැමැත්තකින් තොරව සිදු කළ උත්සාහයන් නොවේ.

අන්තර්ජාතික වශයෙන්, වැඩි විරෝධයකින් තොරව රජය LGBTQI+ ප්‍රජාව යම්තාක් දුරට පිළිගෙන ඇති අතර LGBTQI+ ප්‍රජාවගේ ගැටලු විසඳීමට අපේක්ෂා කරන බව ද පවසා ඇත. ව්‍යවස්ථාවේ වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂා කිරීමට ඇති වගන්තිය (12) තුළට ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ඇතුළත් වන බවට ගෙන එන ලද තර්කය මෙම පිළිතුරුවල ප්‍රධාන සාධකය වී ඇති අතර විමලසිරි සම්බන්ධ නඩු විභාගය වැනි කරුණු ද ඊට සහාය වී ඇත. එමෙන්ම රජයේ පිළිතුරු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හා වෙනස් කොට සැලකීම්වලින් ආරක්ෂා වීමට ඇති ව්‍යවස්ථාමය ඉඩකඩ වැඩිකිරීමට දුන් පොරොන්දු මත රඳා පැවතිණි. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මඟ නැවතීම සහ රජය විසින් LGBTQI+ ප්‍රජාවේ යහපත සඳහා යම් විධිවිධාන ප්‍රමාණයක් ගෙන තිබීම නිසා, ඉහත කරුණු මත LGBTQI+ ප්‍රජාවේ අයිතීන් පිළිබඳ රජයේ පිළිතුරු පදනම්

---

88 ඉහත සඳහන, ඡේද 23(b)

89 ඉහත සඳහන, ඡේද 24

කිරීම තව දුරටත් අර්ථවත් නොවීය. වසර දහයක පාලන කාලයට පසුව LGBTQI+ ප්‍රජාවේ අයිතීන් සම්බන්ධයෙන් යහපාලන රජයේ ස්ථාවරය සැලකිය යුතු ප්‍රගතියකින් හෝ කැපවීමකින් තොර හිස් ස්ථාවරයක් බව පෙණේ.

සමස්තයක් ලෙස, LGBTQI+ උද්දේශන ප්‍රයත්නයන්හි සාර්ථකත්වය සීමාසහිත වී ඇත. නිර්සාපරාධීකරණය සහ වෙනස් කොට සැලකීම් සම්බන්ධ නීති පැනවීම සිදුවී නොමැත. එමෙන්ම ප්‍රධාන ධාරාවේ දේශපාලන න්‍යාය පත්‍රයන්හි LGBTQI+ අවශ්‍යතා ඉතා අඩුවෙන් ඇතුළත් වී ඇත. මෙම සාර්ථකත්වය අවම වීමට හේතු ලෙස උද්දේශන උත්සහයන් පමණක් පෙන්වාදිය නො හැක. LGBTQI+ ක්‍රියාකාරීන් සම්බන්ධ වූ සියලුම නිල හෝ විධිමත් ක්‍රියාවලීන් ඔවුන්ගේ පාලනයට ඔබ්බෙන් විශාල ලෙස දේශපාලනීකරණය වී තිබිණි. කෙසේවෙතත්, ඉහළ මට්ටමේ දේශපාලන සංයුතිය සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැති නිසා, මෙම ප්‍රතිඵලය අඛණ්ඩව විධිමත් දේශපාලන ක්‍රියාවලීන්වලට (එනම් ඉහළ මට්ටමේ මහජන නියෝජිතයින්, නිලධාරීන් සහ ආයතන සමඟ) සම්බන්ධ වීමේ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්න මතු කරයි.

සමස්තයක් වශයෙන්, පසුගිය වසර 15ක කාලය තුළ සිදුවූ LGBTQI+ උද්දේශනයන් පුළුල් මානව හිමිකම් ප්‍රවේශයක් පෙන්නුම් කරයි. සමලිංගික ලිංගික ක්‍රියාකාරකම් සාපරාධීකරණය සහ සැලකිය යුතු දේශපාලන ආරක්ෂාවක් නොමැතිකම LGBTQI+ ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත කෙරෙහි සිදුකර ඇති බලපෑම හේතුවෙන් මෙලෙස පුළුල් මානව හිමිකම් ප්‍රවේශයක් පෙන්නුම් කිරීම අවශ්‍යතාවයක් ඇත. කෙසේවෙතත්, මෙම මානව හිමිකම් අවධානය හේතුවෙන් LGBTQI+ ප්‍රජාවේ භෞතික සුභසාධනය පිළිබඳ කාරණා කෙරෙහි ඇති ඍජු අවධානය අඩු වී ඇත. එම කරණා කෙරෙහි අවධානය යොමු වී ඇත්තේ සමාජ, ආර්ථික හා සංස්කෘතික අයිතිවාසිකම් යන පසුබිම මත ය. උදාහරණයක් ලෙස භෞතික සුභසාධනය වෙනුවෙන් එලෙස යොමුකරන අවධානය LGBTQI+ ශ්‍රී ලාංකිකයින් සඳහා ඍජු සුභසාධන ගෙවීම්, රැකියා හෝ අධ්‍යාපන ප්‍රතිපාදනය වැනි ක්‍රියාමාර්ග තහවුරු කිරීමට දායක වනු ඇත. එබඳු අවධානයක් පවත්නා උද්දේශන ක්‍රියවලීන් සහ සැලසුම් අභියෝගයට ලක් කිරීමට ඉඩ ඇත. ඊට හේතුව වන්නේ භෞතික සුභසාධනය සම්බන්ධයෙන් සිදුකරන උද්දේශනයන්වල දී අනෙකුත් ආන්තික ප්‍රජාවන් සමඟ LGBTQI+ ප්‍රජාවට සම්බන්ධ වීමට සිදුවීමයි. වර්තමාන උද්දේශන ප්‍රයත්න මුහුණ දී තිබෙන අභියෝග හේතුවෙන්, දේශීය සහ අනෙකුත් LGBTQI+ ක්‍රියාකාරීන් මෙම ගැටලු තවදුරටත් විශ්ලේශනය කිරීම වැදගත් වේ.

ඒ අනුව, LGBTQI+ ක්‍රියාකාරීන් විසින් උද්දේශනය සඳහා වෙනත් ගැටලු, ක්‍රමවේද ගවේෂණය කිරීම වැදගත් වේ. සමීක්ෂණය කරන ලද කාල සීමාව තුළ තුළ දේශීය LGBTQI+ උද්දේශනයන්වල වඩාත් කැපී පෙනෙන සාර්ථකත්වයන්ගෙන් එකක් වන්නේ නෛතික ස්ත්‍රීපුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය නිකුත් කිරීමේ ක්‍රියාවලිය ස්ථාපිත කිරීමයි. මෙය සිදුවූයේ, ඉහළ මට්ටමේ දේශපාලන නියෝජිතයින්ගෙන් හෝ රාජ්‍ය නිලධාරීන්ගෙන් (ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් හෝ අමාත්‍ය නිලධාරීන් වැනි) තොරව මහජන ආයතනයක් සහ ස්වාධින කොමිසමක් සමඟ ඒකාබද්ධව සිදුකළ උද්දේශනයන්වල ප්‍රතිඵලයක් ලෙස ය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණ LGBTQI+ ගැටලු සඳහා පෙනිසිටීම දේශපාලන පක්ෂ ජාලයක් තුළ අභ්‍යන්තරව සිදු වූ උද්දේශනවල ප්‍රතිඵලයක් වන අතර එය පාර්ලිමේන්තුව හෝ අමාත්‍යාංශ හරහා සිදු වූ විධිමත් දේශපාලන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් නො වේ. සාපේක්ෂව මෙම සාර්ථක උත්සාහයන් දෙපාර්තමේන්තු සහ කාර්යාල, පළාත් සහ පළාත් පාලන ආයතන සහ පළාත් සහ පළාත් පාලන නියෝජිතයන් වැනි පහළ දේශපාලන මට්ටමින් අවම, විවෘත ක්‍රියාවලියන් තුළින් උද්දේශනය කිරීමේ වැදගත්කම මතු කරයි.

අන්තර්ජාතික වශයෙන්, ශ්‍රී ලංකාවේ LGBTQI+ ගැටලු සම්බන්ධයෙන් සමාලෝචන ක්‍රියාවලීන් තුළ හා කමිටු තුළ වැඩි පිළිගැනීමක් ඇති කිරීමටත්, ඒ සම්බධයෙන් වැඩි නිර්දේශ ලබා දීමටත් LGBTQI+ ක්‍රියාකාරීන් සිදුකළ උද්දේශනයන් ඉවහල් වී ඇත. අන්තර්ජාතික වේදිකාවල දී LGBTQI+ ප්‍රජාව කෙරෙහි ශ්‍රී ලංකා රජයේ ආකල්පවල සුළු වෙනසක් සිදු කිරීමට ද එම උද්දේශනයන්වලට හැකි වී ඇත. කෙසේවෙතත්, මෙම වෙනස නැවත පෙර පැවති තත්ත්වයට පැමිණිය හැකි අතර, 2005-2010 රජයේ ආකල්පවලට නැවත පැමිණිය හැක. ජාත්‍යයන්තර කමිටු මඟින් ලබා දුන් නිර්දේශ හෝ ඒවාට ශ්‍රී ලංකා රජය විසින් ලබාදුන් පොරොන්දු කිසිම ආකාරයක ආයතනමය වගවීමකට භාජනය නොවන නිසා, LGBTQI+ ප්‍රජාවට එරෙහිව වන ක්‍රියාමාර්ග ගැනීමට රජයට හැකියාව ඇත. පසුගිය වසර 15 තුළ එවැනි ප්‍රතිරෝධ කොපමණ ප්‍රමාණයක් නිර්මාණය වී ඇත්ද යන්න ඉදිරි වසරවල දී පැහැදිලි වනු ඇත.

දැනට පවතින පාලන සහ  රාජ්‍ය තත්ත්වය, අන්තර්ජාතික LGBTQI+ උද්දේශනයන්වල නියැලී සිටින ක්‍රියාකාරීන්ට අභියෝග ගණනාවක් මතු කරයි. අන්තර්ජාතික ක්‍රියාවලීන් හරහා ශ්‍රී ලංකා රජයට නිර්දේශ රාශියක් ලබා දීමට හැකි වුවද, එම නිර්දේශ සඳහා වැදගත් ක්‍රියාමාර්ග කිසිවක් ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කර නැත.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාවලීන් ඇතුළුව ජ්‍යාත්‍යන්තර ක්‍රියාවලීන්ට විරුද්ධ වීමට සකස් වී ඇති ශ්‍රී ලංකා දේශපාලන සංස්කෘතිය හේතුවෙන්, LGBTQI+ ප්‍රජාවේ යහපත සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය දේශපාලන කැමැත්ත ජාත්‍යයන්තර ක්‍රියාවලීන් හරහා පහසුවෙන් උත්පාදනය කළ නො හැකි ය. LGBTQI+ උද්දේශනය සහ LGBTQI+ අනන්‍යතාවන් බටහිර ව්‍යුහයන් හෝ කුමන්ත්‍රණ ලෙස අර්ථකථනය කළ හැකි පරිදි එක්සත් ජාතීන්ගේ සංවිධානවල නිර්දේශයන් සකස් වී ඇත.

මෙම තත්ත්වය වර්තමාන ජාත්‍යයන්තර උද්දේශන උපාය මාර්ග පිළිබඳ අභ්‍යන්තර සමාලෝචනයක වැදගත්කම පෙන්වයි. එම උපායමාර්ග තවදුරටත් කාර්යක්ෂම කළ හැකිද සහ ඒවාට යොදවන ආයෝජන වෙනත් ඵලදායි කටයුත්තකට යෙදවිය හැකි දැයි සොයා බැලිය යුතු ය. මෙය දේශීය LGBTQI+ උද්දේශන සම්බන්ධයෙන් පෙර මතු කළ කරුණු හා සමගාමීව, දේශීය සහ ජ්‍යාත්‍යන්තර උද්දේශනයන්වල නියැලිය හැකි දේශීය LGBTQI+ සංවිධානවල සංදර්භය තුළ විශ්ලේශනය කළ යුතු ය.

# පර්යේෂණ

පසුගිය වසර 15 තුළ ශ්‍රී ලංකාවේ LGBTQI+ ගැටලු පිළිබඳ සිදු වූ පර්යේෂණ විවිධ තේමාවන් යටතේ සංවිධානය කළ හැකි ය; එම තේමාවන්වලට ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම; නෛතික තත්ත්වයන්; අනන්‍යතාවය ගොඩනැගීම; HIV සම්බන්ධයෙන් සිදුකරන ලද මැදිහත්වීම්; LGBTQI+ සංවිධාන සහ මෙම කරුණු සහ වෙනත් LGBTQI+ සම්බන්ධ කරුණු පිළිබඳ ව ක්‍රියාකාරීන් ලෙස මැදිහත්වීම් සම්බන්ධයෙන් තොරතුරු එක් රැස්කිරීම් ඇතුළත් වේ.

## *ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම පිළිබඳ අත්දැකීම්*

ශ්‍රී ලංකාවේ LGBTQI+ ප්‍රජාව මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම සමීක්ෂණයට සලකා බලන ලද පර්යේෂණයන්වල වැදගත් තේමාවක් විය. රාජ්‍ය සහ රාජ්‍ය නොවන / පෞද්ගලික ආයතන සහ පුද්ගලයින් සමඟින් LGBTQI+ ප්‍රජා සාමාජිකයින් ලද අත්දැකීම් සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීමට පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක්ම සම්මුඛ සාකච්ඡා සහ සමීක්ෂණවලින් සමන්විත වී තිබුණි.

පොලීසිය වැනි නීතිය ක්‍රියාත්මක කරන නියෝජිතයන් සම්බන්ධ වී ඇති අවස්ථාවන්වල ප්‍රචණ්ඩත්වයට අදාළ අත්දැකීම් බහුලව දක්නට ලැබුණි. නිදසුනක් ලෙස හියුමන් රයිට්ස් වොච් ආයතන 2016 පළ කරන ලද 'ඇඟිලි පහම එක හා සමාන නොවේ' වාර්තාවේ සඳහන් පරිදි එවැනි අත්දැකීම් වාචික හා ශාරීරික හිරිහැර, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම, ශාරීරික හා ලිංගික හිංසනය සහ අල්ලස් වැනි ප්‍රචණ්ඩත්වයන්ගෙන් සමන්විත වී ඇත.[90] ශ්‍රී ලංකාවේ නගර හතරක LGBTQI+ පුද්ගලයින් 61 දෙනෙකු ඇතුළු රජයේ නිලධාරීන් 17 දෙනෙකු, මානව හිමිකම් ක්‍රියාකාරීන්, නීතිඥන්, වෛද්‍ය වෘත්තිකයන් සහ සමාජ සේවා වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් සිදුකරන ලද සම්මුඛ සාකච්චා මත පදනම්ව සකස් කරන ලද මෙම වාර්තාව, ශ්‍රී ලංකාව තුළ LGBTQI+ අනන්‍යතාවයන් සාපරාධී කිරීම හේතුවෙන් වින්දිතයින්ට සිදු වූ ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව යුක්තිය ලබා ගැනීම සඳහා අදාළ විධිමත් ක්‍රියාමාර්ගවලට ප්‍රවේශවීමෙන් වැළකී සිටින බව පෙන්වා දේ.[91]

දමිත් චන්දිමාල් විසින් ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් සිදු කරන ලද කාලීන විශ්ලේෂණයක දී ද, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට පොලිසිය විසින් සිදු කරන ප්‍රචණ්ඩත්වය ඇතුළු ලිංගික බලහත්කාරකම් සහ අල්ලස් පිළිබඳ තොරතුරු සපයා ඇත.[92] දිස්ත්‍රික්ක දෙකක සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් 22 ක් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගත් තොරතුවලින් සකස් වූ මෙම වාර්තාවට අනුව ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ දුන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් විසින් තමන්ටම නඩු පවරනු ඇතැයි යන බිය, වෙනත් ආයතනවල අධෛර්යමත් කිරීම්, මුහුණපෑමට සිදුවිය හැකි අපකීර්තිය සහ ලැජ්ජාව යන හේතු නිසා එම ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව යුක්තිය සෙවීමට කටයුතු කර නොමැත.[93]

කාන්තා ක්‍රියාකාරී කණ්ඩායම විසින් 2014 දී පළ කරන ලද, 'ශ්‍රී ලංකවේ ස්ත්‍රී සමලිංගික, ද්වි ලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින් ප්‍රකාශ කරන පරිදි වෙනස්කොට සැලකීම සහ හිංසනය පිළිබඳ අත්දැකීම්' වාර්තාව ද රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයින් විසින් පොදු ස්ථානවල සිදු කරන ප්‍රචණ්ඩත්වයන් ගැන තොරතුරු සපයා ඇත.[94] ස්ත්‍රී සමලිංගික, ද්වි ලිංගික, ට්‍රාන්ස් පුද්ගලයින් සමඟ

---

90 හියුමන් රයිට්ස් වොච්, ඇඟිලි පහම එක හා සමාන නොවේ - ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය පිළිබඳ මත පදනම්ව සිදුවන වෙනස්කම් කිරීම, 2016,https://www.hrw.org/report/2016/08/15/all-five-fingers-are-not-same/discrimination-grounds-gender-identity-and-sexual

91 ඉහත සඳහන

92 දමිත් චන්දිමාල්, ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය විශ්ලේෂණය කිරීම, ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් මුහුණ දෙන අපකීර්තිය, වෙනස් කොට සැලකීම සහ හිංසනය පිළිබඳ ස්ථානීය තක්සේරුව, ඊක්වල් ග්‍රවුන්ඩ්, කොළඹ, 2014,

93 ඉහත සඳහන

94 ඩබ්ලිව්.එස්.ජී, ශ්‍රී ලංකාවේ එල්බීටී පුද්ගලයින් පැවසූ පරිදි ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම පිළිබඳ අත්දැකීම්, WSG 2014. මෙම වාර්තාව අන්තර්ජාතික සමරිසි කාන්තා සහා පිරිමි මානව හිමිකම් කොමිසමේ මුලිකත්වයෙන් රටවල් පහක ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන ලිංගික දිශානතිය, ස්ත්‍රීපුරුෂ භාවය හෝ ස්ත්‍රීපුරුෂ භාවය ප්‍රකාශනය පදනම් කරගෙන ස්ත්‍රී-පුරුෂ නොවන කාන්තාවන්ට සහ සංක්‍රාන්ති ලිංගිකයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීමේ ආසියා ක්‍රියාකාරී පර්යේෂණහි කොටසකි.

පැවැත්වූ සම්මුඛ සාකච්ඡා 33 ක් හා වෙනත් පාර්ශවකරුවන් 51 සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මත පදනම්ව සකස් කරන ලද මෙම වාර්තාව පෞද්ගලික ස්ථානවල සිදු වන ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන්ද තොරතුරු සපයා ඇත. මෙයට විශේෂයෙන්ම පවුලේ සාමාජිකයින් සහ සහකරුවන්ගෙන් සිදුවන මානසික ප්‍රචණ්ඩත්වය ඇතුළත්වන අතර මෙය ස්ත්‍රී සමලිංගික, ද්වි ලිංගික, ට්‍රාන්ස් පුද්ගලයන් ප්‍රචණ්ඩත්වයට මුහුණපාන් ස්ථාන පැහැදිලිව හඳුනාගැනීම සංකීර්ණ කර ඇත.[95]

සංක්‍රාන්ති සමාජභාවී කාන්තා ලිංගික ශ්‍රමිකයන් 24 දෙනෙකු සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා 3කින් ලබාගත් තොරතුරුවලින් ඇන්ඩ්‍රියා නිකොල්ස් විසින් සකස් කරන ලද 'ඩාන්ස් පොන්නයා ඩාන්ස්' විශ්ලේෂණය පොලිසිය විසින් එම පුද්ගලයන්ට සිදුකරන හිංසනයන් සහ හිරිහැර පිළිබඳ සාකච්චා කරයි.[96] එය පෙන්වා දෙන්නේ සංක්‍රාන්ති සමාජභාවී කාන්තා ලිංගික ශ්‍රමිකයන්ගේ ස්ත්‍රී සමාජභාවී ප්‍රකාශනය සහ සමරිසි භාවය ඉල්ලක්ක කරගනිමින් පොලිසිය විසින් මෙම හිංසනයන් සිදු කරන බවයි.[97] මෙම අපයෝජනයන් අතරට වාචික, ශාරීරික හා ලිංගික අපයෝජන ඇතුළත් වේ. එමෙන්ම මෙම හිංසනයන්ගේ වින්දිතයන් ලෙස සහ පොලිසිය විසින් හඳුන්වන අපරාධකරුවන් ලෙස ඔවුන්ට මෙම අනන්‍යතාවයන් දෙක සඳහා පොලිසියෙන් අසාමාන ප්‍රතිචාර ලැබේ.[98]

මෙම පර්යේෂණය LGBTQI+ පුද්ගලයින් අත්විඳින මෙවැනි හිරිහැර හා ප්‍රචණ්ඩත්වයන් සම්බන්ධයෙන් පොදු නිගමන කිහිපයකට එළඹේ. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ පුද්ගලයන් විසින් පවත්වාගෙන යන හිංසා පීඩා කිරීමේ සංස්කෘතියට උරදීම සහ වින්දිතයින්ට නිශ්ශබ්දතාවය හා ලැජ්ජාව ඇතිකරන වාතාවරණයක් ඇති කිරීම හේතුවෙන් පවත්නා අපරාධ නීතිය විශාල බාධාවක් වී ඇත. එමෙන්ම පුද්ගලයෙකුගේ සත්‍ය හෝ පරිකල්පනය කරන ලද ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිගැනීමට ඇති අකමැත්ත ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර සිදු කිරීමේ මුලාරම්භය බව මෙම පර්යේෂණ ප්‍රතිඵල දිගින් දිගටම ඉස්මතු කරයි. මෙලෙස පිළිගැනීමට ඇති අකමැත්ත පුද්ගලයින්ගේ සත්‍ය ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය, ඔවුන් ප්‍රචණ්ඩත්වයට මුහුණපාන සමාජ සැකසුම සහ ආර්ථිකමය පසුබිම යන කරුණු මත පදනම්ව විවිධාකාරයේ වින්දිත තත්ත්වයන් සහ ස්වභාවයන් ඇති කරයි. නිකොල්ස්ගේ 'ඩාන්ස් පොන්නයා ඩාන්ස්' විශ්ලේෂණයට අනුව මෙය ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ඇතුළත් වූ වින්දිතයන්ගේ අන්තර්-ආන්ශිකත්වය පිළිඹිබු කරයි.[99]

සමහර පර්යේෂණ, LGBTQI+ පුද්ගලයින්ගේ හිංසනය සහ වෙනස්කොට සැලකීම හා සම්බන්ධ අත්දැකීම් සම්බන්ධයෙන් ගවේෂණය කළ අතර, එහිදී පෙනී ගියේ සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, නිවාස හා සේවා නියුක්තිය වැනි මූලික අවශ්‍යතා සඳහා ප්‍රවේශ වීමේ දී ප්‍රචණ්ඩත්වය පවතින බවයි. LGBTQI+ පුද්ගලයන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ලිංගික දිශානතිය මත පදනම් වූ සහ ඊට ආවේණික වූ වෙනස්කොට සැලකීමේ සහ හිරිහැර කිරීමේ රටාවන් මෙම පර්යේෂණ තුළ දී දක්නට ලැබුණි. උදාහරණයක් ලෙස 'ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය විශ්ලේෂණය කිරීම' වාර්තාව සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් රැකියා ස්ථානවල සහ සෞඛ්‍ය සේවාවලදී මුහුණපාන වෙනස් කොට සැලකීම පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන අතර එම වෙනස් කොට සැලකීම සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් අත්විඳින අසාමාන සම්පත් අහිමිවීමට සහ අයහපත් සෞඛ්‍ය ප්‍රතිඵල වලට හේතුවේ.[100]

ජාතික හැඳුනුම්පත වැනි වැදගත් ලේඛන වෙනස් කිරීමේදී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට මුහුණදීමට සිදුවන අනවශ්‍ය, සහ පෞද්ගලිකත්වයට බාධා කරන ආක්‍රමණශීලී ලියකියවිලි සහ ප්‍රශ්න කිරීමේ ක්‍රියාවලීන් හා බලධාරීන්ගේ අත්තනෝමතික තීරණ ගැනීම ඇතුළු අභියෝග ගැන "ඇඟිලි පහම එක හා සමාන නොවේ" යන වාර්තාව විස්තර සපයයි.[101] සංවර්ධනය සඳහා අන්තර්ක්‍රියා සහභාගීත්ව ආයතනය විසින් සිදුකරන ලද '2016 සිට ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති තත්ත්වය තක්සේරු

---

95 ඉහත සඳහන, පි 20-21

96 ඇන්ඩ්‍රියා නිකොල්ස්, "ඩාන්ස් පොන්නයා ඩාන්ස්! ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සංක්‍රාන්ති සමාජභාවී කාන්තා ලිංගික ශ්‍රමිකයන්ට එරෙහිව පොලීසිය සිදුකරන අපයෝජනය", ස්ත්‍රීවාදී අපරාධ විද්‍යාව 5, අංක. 2 (2010) 195222.

97 ඉහත සඳහන

98 ඉහත සඳහන, පි 215-219

99 ඉහත සඳහන

100 චන්දිමාල්, ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය විශ්ලේෂණය කිරීම, පි 39-48.

101 හියුමන් රයිට්ස් වොච්, "ඇඟිලි පහම එක හා සමාන නොවේ".

කිරීම' වාර්තාවේ ද සංක්‍රාන්ති සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට එරෙහිව සිදුවන වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් තොරතුරු සපයා ඇත.[102] සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ HIV සෞඛ්‍ය දැනුම හා HIV සෞඛ්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ සොයාගැනීම් හැරුණු විට, සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන් ඉතා ඉහළ මානසික ආතතියකින් පෙළෙන බව වාර්තාව සොයා ගෙන ඇත. වාර්තාවට අනුව සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී වූ අයගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් යම් අවස්ථාවක දී පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන හෝ රඳවාගෙන ඇත, අවම වශයෙන් හතරෙන් එකක්වත් ඔවුන්ට අදාළ වන නීතිමය සැකසුම් පිළිබඳව ඔවුන්ට ප්‍රමාණවත් දැනුමක් නොමැති බව විශ්වාස කරයි.[103] සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි, සංක්‍රාන්ති සමාජභාවී හිතකාමී සෞඛ්‍ය පහසුකම් ඇති කිරීම පිළිබඳ නිර්දේශ ගණනාවක් මෙම වාර්තාව ඉදිරිපත් කරයි.[104]

විවධ ප්‍රජාවන් මුහුණපාන වෙනස්කොට සැලකීම් තහවුරු කිරීම සඳහා 'වෙනස්කොට සැලකීම පිළිබඳ දර්ශකය' යන මෙවලම යොදාගනී. 2010[105] සහ 2017[106] වසරවල දී ජාතික ලිංගාශ්‍රිත රෝග සහ AIDS මර්දන ඒකකය විසින් HIV සමඟ ජීවත්වන පුද්ගලයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද වෙනස්කොට සැලකීම පිළිබඳ දර්ශකයට HIV සඳහා වැඩි අවධානමක් සහිත ප්‍රජාවක් ලෙස පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි ප්‍රජාව ඇතුළත්වුව ද, LGBTQI අනන්‍යතාවය වැනි කරුණු මත ඔවුන් මුහුණපාන වෙනස්කොට සහ කොන්කොට සැලකීම සම්බන්ධයෙන් පුළුල් විශ්ලේෂණයක් ඊට ඇතුළත් නොවිය. LGBT පුද්ගලයින් සඳහා ම විශේෂිත වෙනස්කොට සැලකීම පිළිබඳ දර්ශකයක් සකස් කිරීමේ උත්සාහයක් 2012 දී ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතන විසින් සිදු කරන ලදි.[107] LGBT පුද්ගලයින් 119 දෙනෙකු වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලියක් භාවිත කරමින් සකස් කරන ලද එම වාර්තාව සහභාගී වූ LGBT පුද්ගලයින්ගෙන් හතරෙන් තුනක් පමණ විවිධ සමාජ වටපිටාවන්වලදී කායික, වාචික හා මානසික අපයෝජන ඇතුළත් වෙනස්කම්වලට මුහුණ දී ඇති බව අනාවරණය කරයි.[108] ඊට සමගාමීව, තමන් මුහුණ දී ඇති වෙනස්කොට සැලකීම් හේතුවෙන් හටගත් අපකීර්තිය හෝ ලජ්ජා සහගත බව හා තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් පවතින බිය හේතුවෙන් LGBT ශ්‍රී ලාංකිකයන් විසින් LGBT අනන්‍යතාවය හා බැඳුණු වෙනස්කොට සැලකීම් අභ්‍යන්තරකරණය කරගෙන ඇත.[109]

H.U.S සමරවීර සහ B.G.I.M සමරසිංහ පෙන්වා දෙන පරිදි සමරිසි කාන්තා, පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන වෙනස්කොට සැලකීම ශ්‍රී ලංකාවේ සමාජ සම්මතය ලෙස පවතින විෂමලිංගික සංස්කෘතියේ ප්‍රතිඵලයකි.[110] සමරිසි කාන්තා හා පිරිමි, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගයින් සහ ලිංගික ශ්‍රමිකයන් 40 දෙනෙකු යොදාගෙන සකස් කරන ලද ඔවුන්ගේ වාර්තාවෙන් පෙන්වා දෙන්නේ විවිධ අනන්‍යතාවයන් සහිත පුද්ගලයන් විවිධ වෙනස්කොට සැලකම්වලට ලක්වන බවයි; සංක්‍රාන්ති සමාජභාවී පුද්ගයින් සහ ලිංගික ශ්‍රමිකයින් සමාජයෙන් බැහැර කරවීම සම්බන්ධයෙන් වෙනස්කොට සැලකීම්වලට මුහුණ දෙන අතර සමරිසි කාන්තා හා පිරිමි පුද්ගලයින්

---

102 සංවර්ධනය සඳහා අන්තර්ක්‍රියා සහභාගීත්ව ආයතනය විසින් සිදුකරන ලද '2016 සිට ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති තත්වය තක්සේරු කිරීම', NSACP/FPA, 2016, https://www.aidsdatahub.org/sites/default/files/publication/Sri_Lanka_Rapid_Situational_Assessment_of_TGs_2017.pdf

103 ඉහත සඳහන, පි 34-50

104 ඉහත සඳහන, පි 55

105 ජාතික ලිංගාශ්‍රිත රෝග සහ AIDS මර්ධන ඒකකය, UNAIDS, ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංවිධාන සංගමය, ශ්‍රී ලංකාවේ HIV සමග ජීවත්වන පුද්ගලයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද වෙනස්කොට සැලකීම පිළිබද දර්ශකය, ශ්‍රී ලංකාව, කොළඹ: NSACP, 2010, https://www.aidsdatahub.org/sites/default/files/documents/UNAIDS,_Family_Planning_Association_Sri_Lanka_and_Partners_(2010)_People_Living_with_HIV_Stigma_Index_Sri_Lanka.pdf

106 ජේ. විදනාපතිරණ, බී. සේනානායක, එන්. විජේගුණවර්ධන සහ එම්. ප්‍රනාන්දු, ශ්‍රී ලංකාවේ HIV සමග ජීවත්වන පුද්ගලයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද වෙනස්කොට සැලකීම පිළිබද දර්ශකය, ශ්‍රී ලංකාව, කොළඹ: NSACP, 2017,https://www.aidsdatahub.org/sites/default/files/publication/Sri_Lanka_Stigma_Assesment_of_PLHIV_2017.pdf

107 ඊක්වල් ග්‍රවුන්ඩ්, ශ්‍රී ලංකාව සඳහා සමරිසි කාන්තා, පිරිමි, ද්විරිසි කාන්ත සහ පිරිමි, සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන් සඳහා වෙනස්කොට හා කොන්කොට සැලකීම පිළිබද දර්ශකය, කොළඹ, 2021, https://equalgroundsrilanka.blog/wp-content/uploads/2017/12/The-LGBT-Stigma-and-Discrimination-Index-of-Sri-Lanka-A-project-of-EQUAL-GROUND.pdf

108 ඉහත සඳහන, පි 102-3

109 ඉහත සඳහන, පි 104

110 H.U.S සමරවීර සහ B.G.I.M සමරසිංහගේ 'කතා නොකළ යුතු මාතෘකාවක ලෙස පවතින ලිංගිකත්වය: නාගරික ශ්‍රී ලංකාවේ LGT අනන්‍යතාවන්ට සහ ලිංගික ශ්‍රමිකයින්ට එරෙහි සමාජ වෙනස්කම් කිරීම', 9 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ක්‍රියා පටිපාටි, රත්මලාන, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (2016), පි. 50-54.

සමාජය තුළ කොන්කිරීම සම්බන්ධ වෙනස්කොට සැලකීම්වලට මුහුණ දේ.[111] ඒ හා සමානව D.M ලියනගේ සහ A.S අධිකාරම්ට අනුව ශ්‍රී ලංකාවේ රැකියා ස්ථානවල වෙනස්කම් කිරීම බහුලව දක්නට ලැබේ.[112] සමරිසි පිරිමි සේවා නියුක්තිකයන් 16 දෙනෙකු සමඟ ඔවුන් කළ සම්මුඛ සාකච්ඡාවලින් සකස් කර ඇති ඔවුන්ගේ වාර්තාව රැකියා ස්ථානවල LGBTQI+ පුද්ගලයින් මුහුණ දෙන නෙරපා හැරීම, ප්‍රතික්ෂේප කිරීම, අපහාසාත්මක අදහස් දැක්වීම, ලිංගික ආභාෂය, නිතර නිතර විහිළු කිරීම සහ පටපදින ලද නම් කීම, සිදුකරන ලදැයි පවසන ලිංගික අතවර සම්බන්ධයෙන් කටකතා පැතිරවීම, අනවශ්‍ය ස්පර්ශයන් සහ ලිංගික ඇසුරු කිරීම් සඳහා තර්ජන හෝ අල්ලස් ලබා දීම පිළිබඳව විස්තර සපයයි. මෙම වාර්තාව, මෙය වර්ගීකරණය කරන්නේ සේවා ස්ථානවල සම්මතය ලෙස පවතින විෂමජාතීයතාවයෙන් / විෂමලිංගික වටිනාකම් නිසා පැන නඟින විෂමලිංගික හිරිහැරයක් ලෙෂ ය.[113] සමරිසි පිරිමි සේවා නියුක්තිකයන් මෙවැනි විෂමලිංගික හිරිහැරයන්ට මුහුණ දෙන ආකාරය එම කතුවරුන් විසින් ම කරන ලද වෙනත් අධ්‍යයනයකින් ද ගවේෂණය කර ඇත.[114] එම වාර්තාවට අනුව මෙම හිරිහැරවලට මුහුණදීමේ උපායමාර්ග ෂමරිසි පිරිමි සේවා නියුක්තිකයන් මුහුණ දෙන නාමකරණය සහ වෙන් කොට සැලකීම සමඟ බැඳී පවතී. මෙම උපායමාර්ග මෙම පුද්ගලයින් විසින් තමන්ට සිදුකරන නාමකරණය පිළිගැනීම හෝ නො පිළිගැනීම මත හා ඔවුන්ගේ ලිංගික දිශානතිය සම්බන්ධයෙන් පැවතී විවෘතභාවය මත පදනම්ව විවිදධ ස්වරූප ගනි.[115]

පර්යේෂණ කිහිපයක්, මාධ්‍ය සංදර්භය තුළ සිදුවන මෙම වෙනස් කොට සැලකීම ග්‍රහණය කරගෙන ඇත. HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන්ට එරෙහිව ඇති වෙනස්කොට සැලකීම සහ කොන්කොට සැලකීම මුද්‍රිත මාධ්‍ය විසින් තවදුරටත් පැතිරවීම සම්බන්ධයෙන් UNDP ආයතනය සිදුකරන ලද අධ්‍යනයකදී සොයා ගැනුණේ අනෙකුත් HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන්ට සාපේක්ෂව HIV සමඟ ජීවත්වන පුද්ගලයන්, පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමින් සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සම්බන්ධයෙන් සිදුවන වර්තාකරණය ඉතා අවම මට්ටමක (පිළිවෙලින් 5%, 1.7% සහ 0.5%) පවතින බවයි.[116] කෙසේවෙතත් එම වාර්තාවන් සිදු වී තිබුණේ ඉතා ඍණාත්මක ආකාරයෙනි. ඒවායේ පෙන්වා තිබුණු අදහස් අතරට සමරිසිභාවය සහ සංක්‍රාන්ති සමජභාවය භයානක බව, එම අනන්‍යතාවයන් ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන බෞද්ධ සංස්කෘතියට තර්ජනයක් බව, විකෘති බටහිර සංස්කෘතියක් නියෝජනය කරන බව හා කුඩා දරුවන් කෙරේ දක්වන කාමාශාව සැඟවීමට එය යොදාගන්න බව ඇතුළත් විය.[117] 'ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය විශ්ලේෂණය කිරීම' යන වාර්තාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ට එරෙහිව මාධ්‍ය හරහා සිදුවන වෙනස්කොට සැලකීම් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වේ.[118]

## *නෛතික තත්ත්වය*

අරිත වික්‍රමසිංහ පවසන පරිදි ශ්‍රී ලංකාවේ සිටින LGBTQI+ ප්‍රජාව සාපරාධීකරණය කිරීමේ නීති, දැනට ලංකාව තුළ මතුවන නඩු නීති, ජාත්‍යයන්තර නීතිය සහ විවිධ අන්තර්ජාතික වේදිකාවල රජයේ ප්‍රකාශ සමඟ සසඳා බැලීමේදී පෙනී යන්නේ, ශ්‍රී ලංකාව තුළ LGBTQI+ ප්‍රජාවේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය සහ වෙනස් කොට සැලකීම්වලින් තොරවීමට ඇති අයිතිය වක්‍රාකාරයෙන් ආවරණය වන බව සහ වැඩිහිටියන් අතර කැමැත්තෙන් ඇතිවන සමලිංගික ලිංගික

[111] ඉහත සඳහන, පි 53

[112] D.M ලියනගේ සහ A.S අධිකාරම්, 'සමරිසි පිරිමින්ට ශ්‍රී ලංකාවේ විෂමජාතීය සේවා ස්ථානවල සිදුවන හිරිහැර පිළිබඳ අත්දැකීම්', කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, 2017.

[113] ඉහත සඳහන

[114] D.M ලියනගේ සහ A.S අධිකාරම් , 'ලේබලයන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම: සමරිසි පිරිමි රැකියා නියුක්තිකයන්ගෙන් සිදුවන හිරිහැර සමඟ කටයුතු කරන්නේ කෙසේද', කළමනාකරණය තුළ ස්ත්‍රී පුරුෂසමාජ භාවය, වෙළුම.34 අංක 8, (2019), පි 644-64

[115] ඉහත සඳහන, පි 657-63

[116] N. සර්මා සහ H. බිලිමෝරියා, අපකීර්තිය, වෙනස් කොට සැලකීම සහ අධි අවධානම් කණ්ඩායම්: ප්‍රවෘත්ති මාධ්‍ය ආවරණය පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් තුළින් ශ්‍රී ලංකාවේ මාධ්‍ය උපදේශනයේ කාර්යභාරය ශක්තිමත් කිරීම. බැංකොක්, UNDP, 2013, පි. 6.

[117] ඉහත සඳහන, පි 7

[118] චන්දිමාල්, ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය විශ්ලේෂණය කිරීම, පි 59-60.

ක්‍රියා වක්‍රාකාරයෙන් නිර්සාපරාධී ව ඇති බවයි.[119] මෙම ස්ථාවරය LGBTQI+ අනන්‍යතාවයට අදාළ සාපරාධී විධිවිධාන පිළිබඳ A.H. විජයත්ගේ සමාලෝචනය සමඟ සමාන වේ.[120]

පොලීසිය, නීතිඥයින්, වෛද්‍ය වෘත්තිකයන්, LGBT ප්‍රජා සාමාජිකයින්, මානව හිමිකම් සංවිධාන සහ ක්‍රියාකාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා 109 ක් භාවිත කරමින් සිදු කරන ලද අධ්‍යයනයක, ප්‍රියා තංගරාජා විසින් නීතිය සහ LGBT පුද්ගලයින්ට එහි ඇති බලපෑම තක්සේරු කරයි.[121] එම වාර්තාව මෙම නීති යටතේ LGBT පුද්ගලයන්ගේ ජීවන අත්දැකීම් පිළිබඳ අධ්‍යයනය කරන අතර, ළමා අපයෝජනයට එරෙහි ආරක්ෂාවක් ලෙස 365 සහ 365 A වගන්ති බලධාරීන් විසින් අවධාරනය කිරීම විවේචනය කරමින්, මෙම නීතීන්ට අනුව අත්අඩංගුවට ගන්නා පුද්ගලයින්ට සහනයක් සැලසීමට දැනට පවතින අනෙක් නීති යොදා ගන්නේ කෙසේදැයි ගවේෂණය කරයි.[122] එමෙන්ම LGBT ගැටලු සම්බන්ධයෙන් සංවේදී නීතිඥයන්ගේ ජාලයක් පිහිටුවීමට නීතිඥයින්ගේ ඇති කැමැත්ත ද එම අධ්‍යයනය සොයා බලයි. ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය පිළිබඳ චන්දිමාල්ගේ විශ්ලේෂණයට සහභාගී වූ නීතිඥයන් පවසා සිටියේ ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් දැනට වඩා ශක්තිමත්ව එක්රැස් වියයුතු බවත්, එලෙස එක්රැස්වීමේ දී ප්‍රජාව තුළ පවතින බාධාවන් සහ මූලික අයිතිවාසිකම් පෙත්සම් වැනි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී ඇතිවන දුෂ්කරතා පිළිබඳ අවධානය යොමු කළ බවත් ය.[123]

සම්මුඛ සාකච්ඡා දෙකක් සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා තුනක් භාවිත කරමින් උර්මිලා පුලට් විසින් සිදු කරන ලද අධ්‍යයනයක දී ශ්‍රී ලංකාවේ නීතිය තුළ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් පිළිගත හැක්කේ කෙසේද යන්න ගවේෂණය කරයි.[124] දැනට ශ්‍රී ලංකාව තුළ පවතින සංක්‍රාන්ති සමාජභාවී අනන්‍යතාවයන්වල විවධත්වය මත, ශ්‍රී ලංකාවට ආර්ජන්ටිනාවේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතා නීතිය වැනි නීතියක් ගැළපෙන බව ඇය යෝජනා කරයි. එම නීතිය තුළ පවතින ස්ත්‍රීපුරුෂ සමාජභාවය නීත්‍යානුකූලව පිළිගැනීමට ඇති අඩු පරිපාලනමය බාධක, ස්ත්‍රීපුරුෂ සමාජභාවය සම්බන්ධ සැත්කම් හා මනෝචිකිත්සක මැදිහත්වීම් අනවශ්‍ය වීම සහ එහි පුළුල්, ද්විමය නොවන (ස්ත්‍රීපුරුෂ පමණක් නොවන) සමාජභාවය පිළිබඳ සංකල්පය ඊට හේතු ලෙස දක්වා ඇත.[125]

එක්සත් රාජධානියට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ නෛතික තත්ත්වය දිනුෂා පණ්ඩිතරත්න විසින් අධ්‍යයනයක් තුළින් තක්සේරු කරනු ලබයි. එහිදී ආසියාවේ පැවති බ්‍රිතාන්‍ය යටත් විජිත විසින් සමලිංගික ලිංගික චර්යා නිර්සාපරාධී කිරීම සඳහා විරුද්ධ වීමට හේතු සොයා බලන අතර ඊට ගත හැකි ක්‍රියාමාර්ගද සොයා බලයි.[126] බටහිර රටවල මේ සම්බන්ධයෙන් ඇතිවුණු මෑත කාලීන ප්‍රවණතා, දකුණු හා ගිනිකොණදිග ආසියා රටවල සමලිංගික ලිංගික චර්යා නිර්සාපරාධී කිරීමට දායක නොවන බවත් බොහෝ විට එම කාර්යය තවත් දුෂ්කර කිරීමට දායක විය හැකි බවත් එම වාර්තාවෙන් පණ්ඩිතරත්න පෙන්වා දේ.[127] අපේක්ෂිත ප්‍රතිඵලයට විරුද්ධ ප්‍රතිඵලයක් දෙන නිසා සහ LGBTQI+ අයිතිවාසිකම් පිළිබඳ බටහිර හිමිකාරීත්වය පිළිබඳ වැරදි දැක්මක් පෝෂණය කරන නිසා ඇය පෙන්වා දෙන්නේ බටහිර රජයන් විසින් මේ සම්බන්ධයෙන් සිදුකරන දැඩි ඉල්ලීම් වලින් වැළකී සිටිය යුතු බවයි.[128] ඉහත චන්දිමාල් මෙන් පණ්ඩිතරත්න ද ළමා අපචාර වැළැක්වීම සඳහා සමලිංගික ලිංගික ක්‍රියාකාරකම් සාපරාධිකරණය සාධාරණීයකරණය කිරීම විවේචනය කරයි.[129] ඇය මෙම හේතුව, සාපරාධීකරණය පවත්වා ගෙන යාමට ඉවහල් වන අනෙකුත් හේතු වන,

[119] අරිත වික්‍රමසිංහ, 'සමලිංගිකත්වය සහ නීතිය', කොළඹ නීති විද්‍යාල සමාලෝචනය (2017)' පි 115-124

[120] A.H විජයත්, ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතියේ අයිතිවාසිකම් සහ ලිංගික සුළුතරයන් පිළිබඳ විශේෂ සඳහනක් සහිතව ශ්‍රී ලංකාවේ ලිංගික විවිධත්වය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය ගැන විශ්ලේෂණය, කාන්තා අධ්‍යයන පිළිබඳ 4 වන ලෝක සමුළුවේ ක්‍රියා පටිපාටි, වෙළුම. 3, නිකුතුව 1, 2018, පි 53-63

[121] ප්‍රියා තංගරාජා, ශ්‍රී ලංකාවේ LGBT පුද්ගලයින් සඳහා නීතිමය ආරක්ෂාව ශක්තිමත් කිරීම', නිර්සාපරාධීකරණ මාවත, ඊක්වල් ග්‍රවුන්ඩ්, කොළඹ, 2013.

[122] ඉහත සඳහන, පි 18-22

[123] චන්දිමාල්, ට්‍රාන්ස්ෆෝබියා සංස්කෘතිය විශ්ලේෂණය කිරීම, පි. 69, 77.

[124] පුලට්, උර්මිලා, 'ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති සමාජභාවී වීම; ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ නීතිය', SSRN 2425503 (2012).

[125] ඉහත සඳහන, පි 15-23

[126] දිනුශා පණ්ඩිතරත්න, "ආසියාවේ සමලිංගික සම්බන්ධතා තහනම් කිරීම; නීති ප්‍රතිසංස්කරණයට බාධා කරන සමාජ-සංස්කෘතික සාධක", ඇමරිකානු විශ්ව විද්‍යාල ජාත්‍යන්තර නීති සමාලෝචනය 31, (2016), පි 171-207.

[127] ඉහත සඳහන, පි 73

[128] ඉහත සඳහන, පි 205-7

[129] ඉහත සඳහන, පි 186-89, 193-204.

'සාපරාධීකරණය නීතිමය වශයෙන් භාවිත නොවේ යන වැරදි උපකල්පනය, බටහිර සංස්කෘතික සහ සදාචාරාත්මක ගැතිකමින් නිදහස්වීම යන අදහස, ස්ත්‍රීපුරුෂ සමාජභාවී අසමානතාවලට වඩා ජනවාර්ගික සහ ආගමික බෙදීම් මත පදනම් වූ නීති රාමුව සහ ශක්තිමත් පවුල් රාමු' යන හේතු සමඟ සම්බන්ධ කරයි.[130] M.A.N චන්ද්‍රතිලක සහ P. මහානාමහේවා ද 'ලිංගික දිශානතිය සහ මානව හිමිකම්; ශ්‍රී ලංකාවේ සහ එක්සත් රාජධානියේ අදාළ වන නීති' නමින් සංසන්දනාත්මක නීති අධ්‍යයනයක් සිදු කර ඇත. එම අධ්‍යයනය LGBTQI+ අනන්‍යතාවය සාපරාධීකරණය කිරීමේ සිට නිර්සාපරාධී කිරීම තෙක් එක්සත් රාජධානියේ ඉතිහාසය සහ එහි ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ තත්ත්වය සමඟ සංසන්දනය කරයි.[131]

රජයේ HIV වැළැක්වීමේ උපාය මාර්ගවලට සාපේක්ෂව LGBTQI+ පුද්ගලයන්ට අදාළ වන ශ්‍රී ලංකාවේ නීතිමය සැකසුම් කමනී ජිනදාස විසින් නෛතික අධ්‍යයනයකින් විමසා බලයි.[132] මූලික සේවාවන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීමටත්, ආරක්ෂිත නීති නොමැති නිසා මුහුණ දෙන වෙනස්කොට සැලකීම් අවම කිරීමටත් HIV සමඟ ජීවත්වන පුද්ගලයන්ට සහ LGBTI පුද්ගලයන්ට නීතිමය සහය ලබා දීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බව එම වාර්තාව අවධාරණය කරයි. HIV සමඟ ජීවත්වන, LGBTI සහ HIV සඳහා අධි අවධානමක් ඇති පුද්ගලයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පූර්වාදර්ශයන් ස්ථාපිත කිරීම සඳහා නඩු පැවරීම වැදගත් බව ජිනදාස වාර්තාවෙන් නිගමනය කරයි.[133] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ලිංගික දිශානතිය, ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ HIV සම්බන්ධයෙන් ඇති මානව හිමිකම් පිළිබඳ කටයුතු කිරීමට ඇති හැකියාව සොයා බැලීමට 2013 වසරේ දී UNDP සහ IDLO ආයතන විසින් අධ්‍යයනයක් සිදුකරන ලදි.[134] මානව හිමිකම් කොමිසමේ කාර්ය මණ්ඩලය අතර ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත්භාවය, අවබෝධය සහ ධාරිතාවය සැලකිය යුතු ලෙස අවම මට්ටමක් පවතින බව වාර්තාවෙන් පෙන්වා දෙන ලදි. ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස 2015 දී ප්‍රතිනිර්මාණය කිරීමෙන් පසු මානව හිමිකම් කොමිසමේ මෙම තත්ත්වය විශාල ලෙස වෙනස් වී ඇත.[135]

**අනන්‍යතාවය ගොඩනැගීම**

ශ්‍රී ලංකාවේ LGBTQI+ සම්බන්ධයෙන් සිදුකරන ලද පර්යේෂණයන්, අනන්‍යතාවයන් ගොඩනැගීම සම්බන්ධයෙන් ප්‍රවේශයන් කිහිපයක් හරහා කටයුතු කරන අතර ඒවායින් සමාජ විද්‍යාත්මක හා සායනික ප්‍රවේශයන් වඩාත් ඉස්මතු වී පෙනේ.

ශ්‍රී ලංකාවේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල විසින් 2018 දී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය පිළිබඳ ස්මෝධනය කෘතියට, LGBTQI+ පුද්ගලයින් කිහිප දෙනෙකු ඇතුළුව ලිංගික අනන්‍යතාව පිළිබඳ පුද්ගලික ආඛ්‍යාන මාලාවක් ඇතුළත් වේ.[136] LGBTQI+ පුද්ගලයින් ඔවුන්ගේ අනන්‍යතාවයන් සහ සබඳතා සකසා ගන්නේ කෙසේද සහ ශ්‍රී ලංකාවේ මර්දනකාරී, විෂමජාතීය සමාජය තුළ ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ලිංගික දිශානතිය සකසා ගන්නේ කෙසේද යන්න පිළිබඳ විස්තරයක් එහි ඇතුළත් වේ.[137]

130 M.A.N චන්ද්‍රතිලක සහ P. මහානාමහේවා, 'ලිංගික දිශානතිය සහ මානව හිමිකම්; ශ්‍රී ලංකාවේ සහ එක්සත් රාජධානියේ අදාළ වන නීති'8 වන අන්තර්ජාතික පර්යේෂණ සමුළුව, රත්මලාන, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (2015), 8 වන අන්තර්ජාතික පර්යේෂණ සමුළුව, රත්මලාන, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (2015), පි.110-14.

131 ඉහත සඳහන, පි 23-47, 64-66

132 කමනි ජිනදාස, 'HIV , පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් හා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සම්බන්ධ ආරක්ෂිත නීති', බැංකොක්, UNDP / ජාත්‍යන්තර සංවර්ධන නීති සංවිධානය, 2011.

133 ඉහත සඳහන, පි 7

134 අයේෂා මාගෝ, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව, සෞඛ්‍ය හා ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය ඇතුළත් කිරීම පිළිබඳ ප්‍රාදේශීය ජාතික මානව හිමිකම් ආයතන ව්‍යාපෘතියට වාර්තාව, UNDP / ජාත්‍යන්තර සංවර්ධන නීති සංවිධානය, බැංකොක්හි, 2013.

135 ඉහත සඳහන, පි 6-7

136 සන්තුෂ්‍යා ප්‍රනාන්දු, සෙනෙල් වන්නිආරච්චි සහ ජානකී විදානපතිරණ, ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය පිළිබඳ සමෝධනය, ශ්‍රී ලංකාවේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, කොළඹ, ශ්‍රී ලංකාවේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය, 2018.

137 ඉහත සඳහන, පි 23-47, 64-66.

අනන්‍යතා ගොඩනැඟීම පිළිබඳ තවත් සමකාලීන දළ විශ්ලේෂණයක් කාන්තා හා මාධ්‍ය සාමූහිකය විසින් ප්‍රකාශයට පත් කරන ලද ද්විමය කේතය කඩාබිඳ දැමීම යන වාර්තාවෙන් ඉදිරිපත් කරයි.[138] එම වාර්තාව LGBT පුද්ගලයින්ගේ අන්තර්ජාලය සහ අන්තර්ජාල අවකාශය භාවිත කරන ආකාරය ගැන අධ්‍යයනය කර තිබේ. අන්තර්ජාල අවකාශයෙන් පරිබාහිරව ඇති කරගත නොහැකි සම්බන්ධතා ඇතිකර ගැනීමට ඉඩ සැලසීම, ස්වයං ප්‍රකාශනයට සහ පොදු කතිකාවන්ට සහභාගී වීමට අවස්ථාව ලබා දීම, ගෝලීය Queer කලා කෘතීන්ට ප්‍රවේශ වීමේ හැකියාව යන කරුණු මත LGBTQ ශ්‍රී ලාංකිකයන්ට අන්තර්ජාලය අතිශයින් වැදගත් බව එම වාර්තාව පෙන්වා දී ඇත. ඒ සමඟම මෙම අවකාශය ප්‍රජාව එකිනෙකාගෙන් ඈත් කිරීමටත් ප්‍රජාව එක්රැස්වීමේ හා බලමුළු ගැන්වීමේ ක්‍රියාවලීන්වලට අහිතකර බලපෑම් එල්ල කිරීමටත් සමත් වී ඇත.[139] මෙම වාර්තාවෙන් පෙන්වා ඇති ලිංගික දිශානතිය හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවය විවෘතව නො පැවසීම, සමාජ මාධ්‍ය ගිණුම් කිහිපයක් පවත්වා ගෙන යාම, ඉතා ප්‍රචලිතව සිදුකරන නිර්නාමික හෝ ව්‍යාජ ගිණුම් භාවිතය, ලිංගික සහකරුවන් සොයා ගැනීම යන දෑ සඳහා අන්තර්ජාල අවකාශය භාවිතය ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය සම්බන්ධයෙන් සමෝධානය කෘතියේ ඇති සමහරක් පුද්ගලික ආඛ්‍යානවලදී දැක ගත හැක.[140]

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව තුළ අනන්‍යතාවය ගොඩනැඟීම සම්බන්ධයෙන් ඇති දේශපාලනමය කතිකාවත ලිංගිකත්වය සම්බන්ධ කතිකාවත සමඟ ගැටෙන ආකාරය සම්බන්ධයෙන් අනී බටාචර්යා සහ කර්ල් ප්‍රනාන්දු විසින් සිදුකරන ලද සංසන්දනාත්මක අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස ඔවුන් පවසන්නේ, පුරුෂාධිපත්‍ය හා විෂමජාතීය සංකල්ප මත පදනම් වූ රාජ්‍ය ආයතන විසින් ලිංගිකත්වය පිළිබඳ කතිකාවන් හැඩගස්වා ඇති අතර එම කතිකාවන් සීමාකර ඇති බවයි.[141] ඉතා දෘඪ සහ පවතින සම්මතය මත පදනම් වී ඇති ශ්‍රී ලංකාවේ දැනට පවතින ලිංගිකත්වය ගැන අවබෝධය, ලිංගිකත්වය සම්බන්ධයෙන් පවතින පුළුල් කතිකාවන් විශාල ලෙස සීමා කිරීමටත් පාලනය කිරීමටත් දායක වී ඇත.[142] මෙම රාමුව තුළ අනන්‍යතාවය ගවේෂණය සඳහා උදාහරණයක් ලෙස ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව සම්බන්ධයෙන් ස්වයං අවබෝධය පිළිබඳ ෂර්මාල් විජේවර්ධන පහළ මධ්‍යම පාන්තික ගම්මාන පරිසරවල සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් දෙදෙනෙකු සමඟ සිදු කළ අධ්‍යයනය පෙන්වා දිය හැක. එහිදී සොයා ගැනුනේ මෙම පුද්ගලයන් තමන්ගේ අනන්‍යතාවය ගොඩනැඟීම සඳහා නිරන්තරයෙන්ම තමන්ගේ ම පරිකල්පනයන්වලට යොමුවන බවයි.[143] විජේවර්ධන තර්ක කරන්නේ ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ විවිධත්වය ප්‍රචණ්ඩත්වය සමඟින් නො පිළිගන්නා සමාජයක් තුළ අභිමානයෙන් යුතුව පෙනී සිටීමට ඇති එකම සම්පත වන්නේ මෙම පුද්ගලයන්ගේ ස්වයං අවබෝධය බවයි.[144] මෙම සොයාගැනීම්වලින් පෙනී යන්නේ ස්ත්‍රීපුරුෂ අනන්‍යතාව පිළිබඳ සංකල්ප පොදු (හා බටහිර) සංදර්භයන් තුළ ප්‍රකාශ විය හැකි ආකාරය සමඟ සසඳා බැලීමේ දී, එය දේශීය වශයෙන් වෙනස් සහ විශේෂිත ආකාරවලින් ප්‍රකාශනය වන බවයි.

ජයන්ති කුරු-උතුම්පලා විසින් සම්මත යැයි පිළිගැනෙන ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් සමඟ තම අනන්‍යතාවය හඳුනා නොගන්නා ස්ත්‍රී සමරිසි පුද්ගලයන් 12 දෙනෙකුගේ නියැදියකට අදාළව සිදු ක අධ්‍යයනයක් ස්ත්‍රීන් තුළ පවතින පුරුෂභාවය (female masculinity) පිළිබඳ විශ්ලේෂණය කරයි.[145] සමාජ නිර්මාණාත්මක හා පශ්චාත් නූතනවාදී ප්‍රවේශ භාවිත කරමින් ඇය තර්ක කරන්නේ ස්ත්‍රීන් තුළ පවතින පුරුෂභාවය (female masculinity) 'පුරුෂභාවය' (masculinity) යන සංකල්පය

---

138 පබා දේශප්‍රියා, මයිකල් මෙන්ඩිස්, ෂර්මාල් විජේවර්ධන සහ සුභා විජේසිරිවර්ධන, ද්විමය කේතය කඩා බිඳ දැමීම, කාන්තාව හා මාධ්‍ය සාමූහිකය, කොළඹ, 2017.

139 ඉහත සඳහන, පි 29-64, 102-104.

140 සන්තුෂ්‍යා ප්‍රනාන්දු, සෙනෙල් වන්නිආරච්චි සහ ජානකි විදානපතිරණ, ශ්‍රී ලංකාවේ ලිංගිකත්වය පිළිබඳ සමෝධනය, ශ්‍රී ලංකාවේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, කොළඹ, ශ්‍රී ලංකාවේ ප්‍රජා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය, 2018, පි S153-S165.

141 අනී බටාචර්යා සහ කර්ල් ප්‍රනාන්දු, 'Queer ක්‍රියාකාරීත්වය සහ ලිංගික සුළුතර ප්‍රජාවන්ගේ අනන්‍යතාවය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව පිළිබඳ තත්ත්ව විශ්ලේෂණයක්', 9 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ක්‍රියා පටිපාටි, රත්මලාන, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (2016), පි. 55-62.

142 ඉහත සඳහන, පි 62

143 ෂර්මාල් විජේවර්ධන, 'නමුත් මම දැන් කවුදැයි කිසිවෙකු මට පැහැදිලි කර නැත…' ශ්‍රී ලංකාවේ 'ට්‍රාන්ස්' ස්වයං අවබෝධය, වීරින්ගා එස්.ඊ., බ්ලැක්වුඩ් ඊ., හයියා ඒ. (සංස්) ගෝලීයකරණයවන ආසියාවක කාන්තාවන්ගේ ලිංගිකත්වය සහ පුරුෂභාවය: සංසන්දනාත්මක ස්ත්‍රීවාදී අධ්‍යයන මාලාව, පි. 101-116, නිව් යෝර්ක්, පැල්ග්‍රේව් මැක්මිලන්, 2007.

144 ඉහත සඳහන, පි 101-102

145 ජයන්තිකුරු-උතුම්පලා, 'එය කප්පාදු කිරීම: ශ්‍රී ලංකාවේ සමලිංගික ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ විශ්ලේෂණයක්, සංස්කෘතිය, සෞඛ්‍යය සහ ලිංගිකත්වය, 15: අතිරේකය 2, පි.153-165.

තුළින් පිරිමි සහ පිරිමිභාවය යන අදහස ඉවත්කිරීමට ඉවහල් වන බවයි.[146] කෙසේවෙතත් ඇය තර්ක කරන්නේ සම්මත යැයි පිළිගැනෙන ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් සමඟ තම අනන්‍යතාවය හඳුනා නොගන්නා ස්ත්‍රී සමරිසි පුද්ගලයන් සඳහා 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රතික්ෂෙප් කරන' හෝ එය 'කඩා කප්පල් කරන' යන යෙදුම් භාවිතය ඔවුන් තවත් බල මුළු ගැන්වීමට දායක විය හැකි බවයි. ඊට හේතුව වන්නේ සම්මත යැයි පිළිගැනෙන ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් සමඟ තම අනන්‍යතාවය හඳුනා නොගන්නා ස්ත්‍රී සමරිසි පුද්ගලයන් 'පුරුෂරූපී' ලෙස සිදුකරන ගතානුගතික හැඳින්වීම ඔවුන් ප්‍රතික්ෂේප කිරීම සහ, ඔවුන්ගේ අනන්‍යතාවය සම්මත යැයි පිළිගැනෙන ද්විමය ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් කඩාබිඳ දැමීම හෝ ඉන් ඔබ්බට යාම ලෙස ඔවුන් පිළිගැනීමත් ය.[147]

ශ්‍රී ලංකාවේ නච්චි පුද්ගලයන් ස්ත්‍රීපුරුෂ සමාජභාවී සහ ලිංගික දිශානතිය පිළිබඳ අනන්‍යතාවය සහ කැමැත්ත/ආශාව/අභිරුචිය යන සංකල්ප සංකීර්ණ සහ පරස්පර විරෝධී ප්‍රවේශයන් හරහා අවබෝධ කරගන්නේ කෙසේද යන්න ඇන්ඩෘ නිකොලස් සහ ජෝඩි මිලර් කළ අධ්‍යයනයක ගවේෂණය කරයි.[148] නච්චි පුද්ගලයන් එක් පසෙකින් තමන්ගේ ස්ත්‍රී සමාජීය විෂයානුබද්ධතාවය සමරන අතර, ඔවුන්ගේ ජීව විද්‍යාත්මක "පුරුෂ" අනන්‍යතාවයේ ප්‍රධාන අංගයන් ඉතා තදින් ග්‍රහණය කරගැනීමත්, පිරිමින් සඳහා ඔවුන්ගේ ඇති ලිංගික ආශාවන් පවත්වාගෙන යාමත් සිදු කරයි. එම සංදර්භය තුළ නච්චි පුද්ගලයන්, සිස්ජෙන්ඩර් විෂමලිංගික කාන්තාවන්ට සහ සිස්ජෙන්ඩර් සමරිසි පිරිමින්ට තමන්ව සංසන්දනය කරන්නේ කෙසේද සහ ඔවුන්ගෙන් වෙන්කර හඳුනාගන්නේ කෙසේද යන්න මෙම වාර්තාව විශ්ලේෂණය කරයි. මෙම තර්කයන් සංදර්භානුගත කළ හැක්කේ ගනුදෙනුකාරී ලිංගික හුවමාරුව / සම්බන්ධතා යන සංදර්භයන් තුළ ය. එම සංදර්භය තුළ නච්චි අනන්‍යතාවය සැකසීම සඳහා ආර්ථික, ආශාවන්, වෙනස්කොට සැලකීම, සූරාකෑම යන කරුණුවල සංකීර්ණ ගතිකතාවයන් දායක වේ.[149]

තේමාල් එල්ලාවලගේ "නොගැළපෙන පෙම්වතුන්" ද මීට සමාන විෂයානුබද්ධ අනන්‍යතා ගොඩනැඟීම පිළිබඳ සමාන අධ්‍යයනයකි.[150] ලිංගික දිශානතිය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතා සංවර්ධනය පිළිබඳ මනෝ විද්‍යාවේ හා සමාජ විද්‍යාවේ ඇති න්‍යායන් ශ්‍රී ලංකාවේ විෂමලිංගික නොවන සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට අදාළ වන්නේ කෙසේද යන්න එම අධ්‍යයනය ගවේෂණය කරයි. 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදු කරන ලද මෙම ගුණාත්මක අධ්‍යයනය තුළින් සොයා ගැනුණේ සහභාගිවූවන්ගේ ලිංගිකත්වය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් ගොඩනැඟීම පිළිබඳ ස්වයං-සංකල්ප ප්‍රධාන අනන්‍යතා සංවර්ධන න්‍යායන් සමඟ සැලකිය යුතු ලෙස නොගැළපෙන බවයි.[151] ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය හැදෑරීමේ දී පුද්ගල වෙනස්කම් සහ සංස්කෘතික සංදර්භයන් සලකා බැලීමේ අවශ්‍යතාව අවධාරණය කිරීමට මෙය හේතුවන අතර මේ ආකාර න්‍යායන් විවිධ සංස්කෘතීන් හරහා සමාන කිරීමට උත්සහ කිරීමේ ආදීනව ද පෙන්වා දේ.[152] මේ අනුව අනන්‍යතාවයන් පිළිබඳ බටහිර අදහස්, සංකල්ප, න්‍යායන් සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය පිළිබඳ දේශීය අවබෝධය සහ භාවිතයන් අතර පවතින වියුක්තිය පිළිබඳ විජේවර්ධන, කුරු-උතුම්පලා සහ නිකල්ස් සහ මිලර් ගේ අදහස් එල්ලාවල ද සනාථ කරයි.

LGBTQI+ අනන්‍යතාවය සඳහා යොදා ගන්නා සායනික ප්‍රවේශයන්, මනෝ විද්‍යාත්මක තක්සේරු කිරීම් සහ සමාජ හා සෞඛ්‍ය ඇගයීම් වඩාත් සරලව භාවිත කරයි. ඒවායේ ප්‍රතිඵලයන් ලෙස සිදුවන විචාර, න්‍යායාත්මකකමින් අඩු ප්‍රායෝගිකකමින් වැඩි විචාර වේ. වෙනස් කොට සැලකීම, ලිංගික වෘත්තීය, ලිංගික සෞඛ්‍ය සැකසුම් සහ දේශීය හා ජාත්‍යයන්තර සංවර්ධනයන් යොදා ගනිමින් A.S මලලගම විසින් ශ්‍රී ලංකාව තුළ ද්විමය ස්ත්‍රීපුරුෂ සමාජභාවයට නොගැළපෙන අනන්‍යතා

146 ඉහත සඳහන, පි S163.
147 ඉහත සඳහන
148 ජෝඩි මිලර් සහ ඇන්ඩ්‍රියා නිකල්ස්, 'ශ්‍රී ලාංකික නච්චි අතර අනන්‍යතාවය, ලිංගිකත්වය සහ වාණිජ ලිංගික ශ්‍රමිකත්වය', ලිංගිකත්වය 15, නොම්මර. 5/6 (2012), පි 554-69.
149 ඉහත සඳහන, පි 561-66.
150 තේමල් එල්ලාවල, "නොගැළපෙන පෙම්වතුන්: ශ්‍රී ලංකාවේ LGBTQ+ අනන්‍යතා න්‍යායන් සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය හා ලිංගික බහුත්වය අතර ඇති ගැලපුම ගවේෂණය කිරීම", ලිංගිකත්වය සහ සංස්කෘතිය 22 (2018), පි 1321-39.
151 ඉහත සඳහන
152 ඉහත සඳහන, පි 1334-36.

ගොඩනැඟීමක් සිදු කරයි.[153] විශේෂයෙන් ම ශ්‍රී ලංකා ලිංගික සෞඛ්‍ය හා HIV පිළිබඳ වෛද්‍ය විද්‍යාලය සහ මනෝචිකිත්සක විද්‍යාලය සහයෝගීතාවයෙන් යුතු ව ශ්‍රී ලංකාව තුළ පවතින ද්වීමය ස්ත්‍රීපුරුෂ සමාජභාවයට නොගැළපෙන අනන්‍යතා අධ්‍යයනය කර විෂමජාති බව පාදක කරගත් සමාජයෙන් ඔවුන්ට එල්ලවන හිරහැර අවම කිරීමට හැකියාව ඇති බව ඇය අවසාන වශයෙන් පවසයි.[154]

මියුරු චන්ද්‍රදාසගේ යෞවනයන් ඍසමරිසි පිරිමි යෞ"සමරිසි යෞවනයන් තුළ සියදිවි නසාගැනීම්" පිළිබඳ වාර්තාවේ ද LGBTQI+ පුද්ගලයින්ගේ මානසික සෞඛ්‍ය නඟා සිටුවීම සඳහා මනෝ චිකිත්සකයින් සහ අනෙකුත් සෞඛ්‍ය වෘත්තිකයන් ප්‍රතිපත්ති හා දේශපාලන ක්ෂේත්‍රවලට සිදු කළ යුතු මැදිහත් වීම් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වේ.[155]

'සංක්‍රාන්ති සමාජභාවීත්වය පිළිබඳ යාවත්කාලීන කිරීම' යන වාර්තාවේ මලලගම සහ S. ගිනිගේ විසින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ ඇති ඩිස්ෆෝරියාව සහ වෙනස්කොට සැලකීම පිළිබඳ ඇති අත්දැකීම්, ඔවුන්ගේ අනෙකුත් රෝගවලට සමගාමීව පවතින මානසික අවපීඩනය, කාංසාව සහ සියදිවි නසා ගැනීම ඇතුළු ඉහළ ගොස් ඇති මනෝ ව්‍යාධීන් ගැන දළ විග්‍රහයක් සපයයි.[156] ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ ඇති ඩිස්ෆෝරියාව කළමනාකරණය කිරීම සඳහා මනෝචිකිත්සකයින්, අන්තරාසර්ග විශේෂඥයින්, නාරිවේද විශේෂඥයින්, ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍යවරුන්, උපදේශකයින්, සමාජ සේවකයින්, නීතිඥයින්, රාජ්‍ය නොවන සංවිධාන, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් අතර සහයෝගීතාවය තුළින් ඇති කරගත යුතු බහු ආංශික ප්‍රවේශයක් සකස් කිරීම සඳහා කතුවරුන් මෙයින් උද්දේශනය කරයි.[157]

මෙම කරුණු සම්බන්ධයෙන් ඉහත තොරතුරුවලට සමාන තොරතුරු, ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව සම්බන්ධ වසංගත රෝග සාධක පිළිබඳ ප්‍රකාශිත දත්ත නොමැතිකම පෙන්වීමට තෘතියික සත්කාර සායන පසුබිමක වසංගත රෝග ලක්ෂණ අධ්‍යයනය කිරීම සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සඳහා ඇතිස ායනයකට සහභාගී වූවන් කළමනාකරණය කිරීම හරහා සිදුකරන ලද අධ්‍යයනයක් තුළින් ඉහත කතුවරුන් සහ පී.ඩී.එල්.ආර්. විජේසිංහ සහ එන්. ගුණවර්ධන සපයා ඇත.[158] පේරාදෙණිය ශික්ෂණ රෝහලේ 1985 සිට 2018 කාලය දක්වා සතිපතා පැවැත්වෙන වැඩිහිටි මනෝචිකිත්සක සායනය සහ ලිංගික ආබාධ සායනයෙහි ලියාපදිංචි වී ඇති සියලුම සංක්‍රාන්ති සමාජභාවී පුගලයින්ගේ සායනික වාර්තා මෙම අධ්‍යයනය මඟින් සමාලෝචනය කර ඇත. අධ්‍යයනයට අනුව මනෝ චිකිත්සක උපකාර ලබා ගන්නා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ සංඛ්‍යාව වැඩි වෙමින් පවතින බවත් ඔවුන්ට ලබාගත හැකි සේවාවන්වල විශාල අඩුපාඩු පවතින බවත් සොයාගෙන ඇත.[159] අදාළ වෘත්තීය කණ්ඩායම්වල සහ පොදුවේ අධ්‍යාපනය තුළ ආකල්පමය වෙනසක් නිර්දේශ කිරීමට සමගාමීව, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් හට සෞඛ්‍ය සේවා ලබාදීමට සිටින සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාව සඳහා ජාතික පිළිවෙත් මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීම නිර්දේශ කිරීම මෙම වාර්තාවෙන් සිදු කරයි.[160]

## *HIV* ආශ්‍රිත මැදිහත්වීම්

සමීක්ෂණය සඳහා සලකා බලන ලද කාලසීමාව තුළ සිදුවී ඇති පර්යේෂණවලින් වැඩි කොටසක්ම HIV වැළැක්වීම සහ ප්‍රතිකාර කිරීම සඳහා සෞඛ්‍ය සේවා මැදිහත්වීම් පිළිබඳ සිදු කර ඇති පර්යේෂණ වේ. LGBTQI+ ප්‍රජාවන් පිළිබඳ විශේෂයෙන් ම සිදුකරන ලද මුල් ම පර්යේෂණ අතරට 2017 දී ගමන් මගේ සහකරුවෝ සංවිධානය විසින් සමරිසි සහ පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන

153 එස්. මලලගම, 'ස්ත්‍රීපුරුෂ අනන්‍යතාවයේ වෙනස්කම් සහ ශ්‍රී ලංකාවේ තත්ත්වය', ශ්‍රී ලංකා ලිංගික සෞඛ්‍ය හා HIV වෛද්‍ය සඟරාව, 3 වන වෙළුම, (2017)', පි 45-50.

154 ඉහත සඳහන, පි 50

155 මියුරු චන්ද්‍රදාස, "ශ්‍රී ලංකාවේ සංස්කෘතිකමය වෙනස්කොට සැලකීම හා සමලිංගිකත්වය සාපරාධී කරවන සංදර්භය තුළ සමරිසි යෞවනයන් තුළ සියදිවි නසාගැනීම් පිළිබඳ අදහස", සමාජ මනෝචිකිත්සාවේ ජාත්‍යන්තර සඟරාව (2018), පි 1-2 .

156 P.ගිනිගේ සහ A.S මලලගම, 'සංක්‍රාන්ති සමජභාවීත්වය පිළිබඳ යාවත්කාලීන කිරීම', ශ්‍රී ලංකා මනෝ චිකිත්සාව පිළිබඳ ජර්නලය 9, අංක. 2 (2018), පි 4-9.

157 ඉහත සඳහන, පි 9

158 පී. ගිනිගේ, ඒ.එස්. මලලගම, පී.ඩී.එල්.ආර්. විජේසිංහ, එන්. ගුණවර්ධන, 'සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාව' ශ්‍රී ලංකා අත්දැකීමක්; ශ්‍රී ලංකාවේ තෘතියික සත්කාර සායන පසුබිමක සිට වසංගත රෝග ලක්ෂණ සහ කළමනාකරණ ගැටලු පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක්. ශ්‍රී ලංකා ලිංගික සෞඛ්‍ය හා HIV වෛද්‍ය සඟරාව, 4 වන වෙළුම, (2018), පි 18-23.

159 ඉහත සඳහන

160 ඉහත සඳහන, පි 22-23

පිරිමි ප්‍රජාව අතර HIV දැනුම සහ ලිංගික චර්යාවන් අධ්‍යයනය කිරීමට සිදුකළ පර්යේෂණයක් ඇතුළත් වේ.[161] නගර 5ක 494 දෙනෙකුගේ සහභාගීත්වයෙන් සිදුකරන ලද මෙම පර්යේෂණයේ වැදගත්ම සොයා ගැනීමක් වන්නේ මෙම ප්‍රජාවන් ශ්‍රී ලංකා සමාජයේ සියලුම කොටස්වල ජීවත්වන සහ රැකියාවල නියුතු වන බවත් ඔවුන් සංචාරක කලාපවලට හෝ ඉංග්‍රීසි භාෂාව කථා කරන, කොළඹ පදිංචි වී සිටින ප්‍රභූ පැලැන්තියට පමණක් සීමා වී නොමැති බවත් ය.[162] ඔවුන් විවිධාකාර HIV අවධානම් සහිත ලිංගික හැසිරීම්වල නිරත වන අතර බහු ලිංගික අනන්‍යතා ඇති පුද්ගලයන් බව එම වාර්තාව පෙන්වා දේ. මෙය බොහෝ විට සමරිසි සහ පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමින් අතරින් ස්ත්‍රීන් මෙන් හැසිරෙන, ගුද සංසර්ගයේ දී අනෙකාගේ ලිංගය ඇතුල් කරගන්නා පුද්ගලයන් පමණක් වන බවට තිබෙන ඒකාකෘත අදහසට විරුද්ධ වේ.[163] එමෙන්ම පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමින් බොහෝ විට ස්ත්‍රීන් සමඟ ද ලිංගිකව හැසිරෙන බවත් සමාජයීය හෝ දේශපාලනිකව සමරිසි ලෙස හඳුනා නො ගන්නා බවත් වාර්තාව පෙන්වා දෙන් අතර මෙය HIV වැළැක්වීමේ ඉලක්කගත උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු අභියෝගයක් බව පෙන්වා දේ.[164]

ජනවාර්ගික අධ්‍යයන සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් HIV / AIDS සම්බන්ධයෙන් අවධානමට ලක්විය හැකි කණ්ඩායමක් ලෙස හමුදාව හඳුනා ගෙන ශ්‍රී ලංකා හමුදා නිලධාරීන්ගේ HIV / AIDS දැනුම තක්සේරු කිරීමටත් ඔවුන් කොපමණ දුරකට HIV සඳහා අවධානම් සහිත ලිංගික හැසිරීම්වල නිරත වනවාද යන්න තක්සේරු කිරීමටත් විශේෂිත පර්යේෂණ ප්‍රවේශයක් සමීක්ෂණයක් හරහා ලබාගෙන ඇත.[165] මෙම වාර්තාවට 'පුද්ගලයන්ගේ සමලිංගික ලිංගික හැසිරීම්වල ඉතිහාසය' පිළිබඳ තොරතුරු ඇතුළත් වන අතර සහභාගී වූවන්ගෙන් තුනෙන් එකක් (30.8%) තමන්ට සමලිංගික ලිංගික සම්බන්ධතා තිබූ බවට වාර්තා කර ඇත.[166]

HIV පිළිබඳ 2006-2007 දක්වා ශ්‍රී ලංකාවේ සිදු කරන ලද පළමු චර්යාත්මක නිරීක්ෂණ සමීක්ෂණයට LGBT ප්‍රජාව විශේෂයෙන් ඇතුළත් නො වුවත් පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි සහ වෙරළාසන්න සේවා සපයන්නන් (බීච් බෝයිස්) ප්‍රජාවන් HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන් ලෙස ඇතුළත් විය.[167] සමීක්ෂණය මඟින් ලිංගික හැසිරීම් මෙන්ම මෙම ප්‍රජාවන්ගේ භූගෝලීය ව්‍යාප්තිය පිළිබඳව සොයා ගැනීම් ගණනාවක් සිදු කරන ලදි.[168] මෙම සමීක්ෂණයෙන් පසුව හා ඊට සමගාමීව, ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන ඒකකය විසින් 2010,[169] 2013[170] හා 2018[171] වසරවල දී HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන් සිතියම්කරණය කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි. 2010 දී සිදුකරන ලද සිතියම්කරණ ක්‍රියාවලියට HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන් ලෙස පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි ප්‍රජාව (මීට සමරිසි පිරිමි, පිරිමි ලිංගික ශ්‍රමිකයන් සහ නච්චි පුද්ගලයින්) ඇතුළත් විය. 2013 දී සිදුකළ ක්‍රියාවලියට පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි සහ සමරිසි, ද්විරිසි හෝ විෂමරිසි වෙරළාසන්න සේවා සපයන්නන් (බීච් බෝයිස්) ඇතුළත් විය. 2018

---

[161] ගමන් මගේ සහකරුවෝ, සමරිසි පිරිමි ප්‍රජාව, සමරිසි පිරිමින් ලෙස හඳුනාගන්නා පිරිමි, පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමින් ප්‍රජාව තුළ දැනුම, ආකල්ප හා භාවිතය, ශ්‍රී ලංකාව, ගමන් මගේ සහකරුවෝ, 2007, https://www.aidscontrol.gov.lk/images/pdfs/publications/research_documents/cojk_nowledge.pdf

[162] ඉහත සඳහන, පි 24

[163] ඉහත සඳහන

[164] ඉහත සඳහන

[165] ජනවාර්ගික අධ්‍යයන සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICES), ශ්‍රී ලංකාවේ අවධානමට ලක්විය හැකි කණ්ඩායම්වල එච්.අයි.වී / ඒඩ්ස් පිළිබඳ දැනුවත්භාවය සහ අවධානම් සහිත ලිංගික හැසිරීම් පිළිබඳ සමීක්ෂණයක්, මහනුවර, ICES, 2009.

[166] ඉහත සඳහන, පි 27-8

[167] පී. රව්ස්ටෝන් සහ එච්. වර්ත්, ශ්‍රී ලංකා චර්යාත්මක නිරීක්ෂණ සමීක්ෂණය, පළමු වටයේ සමීක්ෂණ ප්‍රතිඵල 2006-2007, කොළඹ, සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය, 2007.

[168] ඉහත සඳහන

[169] ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන (NSCAP), ශ්‍රී ලංකාවේ එච්.අයි.වී වැළැක්වීම සඳහා HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන් සිතියම් ගත කිරීම, කොළඹ, NSCAP, 2010, https://www.aidscontrol.gov.lk/images/pdfs/publications/research_documents/hrd_mapping.pdf

[170] ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන (NSCAP), ශ්‍රී ලංකාවේ HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන් පිළිබඳ ජාතික ප්‍රමාණ ඇස්තමේන්තු කිරීම, කොළඹ, NSCAP, 2013, https://www.aidscontrol.gov.lk/images/pdfs/publications/research_documents/national_size_estimation_2013.pdf

[171] ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන (NSCAP), ශ්‍රී ලංකාවේ HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන් පිළිබඳ ජාතික ප්‍රමාණයන් පිළිබඳ වාර්තාව, කොළඹ, NSCAP, 2018, https://www.aidscontrol.gov.lk/images/pdfs/publications/research_documents/Final-draft-report-Key-Population-Size-Estimation--2018July.pdf

දී සිදුකළ ක්‍රියාවලියට පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි සහ වෙරළාසන්න සේවා සපයන්නන් (බීච් බෝයිස්) සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් ඇතුළත් විය.

2010 සිදුකරන ලද සිතියම්කරණ ක්‍රියාවලිය තුළ  දිස්ත්‍රික් මට්ටමින් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හඳුනාගත් කොළඹ සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල භූගෝලීය කලාපයන්හි ස්ථානීය සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදි. දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටම්වලින් දත්ත නිස්සාරණය කිරීම සඳහා 2013 සහ 2018 ක්‍රියාවලියන් දිස්ත්‍රික් ලේකම් කාර්යයාලවල භූගෝලීය කලාපයන්  සිතියම්කරණ ඒකක ලෙස යොදාගත්  අතර ඊට  ස්ථානීය සම්මුඛ සාකච්ඡා ද එකතු කර තිබිණි.

2010 වාර්තාව කොළඹ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි 9,569 ක් සිටින බවට ඇස්තමේන්තු කර ඇත.[172] 2013 වාර්තාව අනුව දිවයින පුරා පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි 7,551 සහ වෙරළාසන්න සේවා සපයන්නන් (බීච් බෝයිස්) 873ක් සිටින බව පෙන්වා දෙන අතර 2018 වාර්තාව දිවයින පුරා පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමි 40,000ක්, වෙරළාසන්න සේවා සපයන්නන් (බීච් බෝයිස්) 4,500ක් සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් 2,200 සිටින බව වාර්තා කරයි. සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් පිළිබඳ 2018 අධ්‍යයනයෙන් සොයාගත් කරුණු ‘ශ්‍රී ලංකාවේ කාන්තා ලිංගික ශ්‍රමිකයින්ගේ සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන්ගේ ජනගහණ ප්‍රමාණය තක්සේරු කිරීම’ යන වාර්තාවේද ඇතුළත් වේ.[173]

මෙම සිතියම්කරණ ක්‍රියාවලීන්වල සොයාගැනීම්, භාවිත කරන ලද ගුණකයන්ගේ විශ්වසනීයත්වය සහ සහභාගීවන්නන්ගේ සංචලතාවය මත සංකීර්ණ වී ඇත. භාවිත කරන ලද ගුණකයන්ගේ විශ්වසනීයත්වය සහ සහභාගීවන්නන්ගේ සංචලතාවය පදනම් වී ඇත්තේ රාජ්‍ය නොවන සංවිධානවලින් ලබාගත් දත්ත ලක්ෂ්‍ය මත ය.[174] භාවිත කළ ක්‍රමවේද මඟින් සැඟවුණු/ සැඟ වී සිටින  ප්‍රජාවන් අවතක්සේරු කළ හැකි බව මෙම අධ්‍යයනයන් පිළිගනී.[175] දත්ත ලක්ෂ්‍ය තවදුරටත් පැහැදිලි කිරීමට සහ වඩාත් නිවැරදි ඇස්තමේන්තු කරා ළඟා වීම සඳහා සාමාන්‍ය ප්‍රජාව පදනම් කරගත් සමීක්ෂණ සමඟ ඒකාබද්ධව මෙම සිතියම්කරණ අභ්‍යාසය නැවත සිදු කිරීමේ අවශ්‍යතාවය මෙම  අධ්‍යයනයන් තුන ම අවධාරණය කරයි.[176] සිතියම්ගත කිරීමේ අධ්‍යයනයන් එකදිගටම සිදු කිරීම සහ ක්‍රමවේදය ක්‍රමක්‍රමයෙන් සංවර්ධනය කිරීම තුළින් පෙනී යන්නේ, LGBTQI+ ප්‍රජාව සම්බන්ධයෙන්  වැඩි අංගයන් ඇතුළත් කිරීම සඳහා HIV සඳහා අධි අවධානමක් ඇති ප්‍රජාවන්ගේ නිර්වචනය පුළුල්  කිරීම තුළින් මෙය සාක්ෂාත් කර ගන්නා ලද බවයි.

විශේෂිතවම  LGBT ප්‍රජාව සිතියම්ගත කිරීම සඳහා අභ්‍යාසයක් 2017 දී ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනය ගන්නා ලදි.[177] එම අධ්‍යයනය කොළඹ, මහනුවර, මාතර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල වැඩිහිටියන් 470 දෙනෙකු සමීක්ෂණයට භාජනය කළ අතර එම දිස්ත්‍රික්කවල වෙසෙන වැඩිහිටියන්ගෙන් දළ වශයෙන් 19.6% (753, 973) ක් සමරිසි කාන්තා, පිරිමි, ද්වි රිසි කාන්තා, පිරිමි හෝ සංක්‍රාන්ති සමාජභාවී  බව ඇස්තමේන්තු කරයි.[178] LGBT පුද්ගලයින්ගෙන් බහුතරයක් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාවය හේතුවෙන් යම් ආකාරයක අභියෝගයකට හෝ බාධකයකට මුහුණ දී ඇති බව අභ්‍යාසය තවදුරටත් පෙන්වා දේ.[179]

---

172 NSCAP, 2010 වාර්තාව, පි. 10.

173 අයි. බොසිසෙවික්, ඒ. මනතුංග, ඉසෙඩ් ඩොමින්කොවිච්, එස්. බෙනරගම සහ කේ. ක්‍රිට්මා, ‘ශ්‍රී ලංකාවේ කාන්තා ලිංගික ශ්‍රමිකයින්ගේ සහ සංක්‍රාන්ති සමාජභාවී  කාන්තාවන්ගේ ජනගහණ ප්‍රමාණය තක්සේරු කිරීම’, PLoS ONE 15 (1), (2020).

174 NSCAP, 2018 වාර්තාව, පි 71-2.

175 බොසිසෙවික් සහ වෙනත් අය, ‘ජනගහනයේ ප්‍රමාණය තක්සේරු කිරීම’, පි. 8.

176 ඉහත සඳහන, පි 8-9, ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන, 2013 ජාතික ප්‍රමාණ ඇස්තමේන්තුව පිළිබඳ වාර්තාව, පි. 85-93; ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන, 2018 ජාතික ප්‍රමාණ ඇස්තමේන්තුව පිළිබඳ වාර්තාව, 71-2 පි.

177 කිමෝන් බ්‍රවුන්, කොළඹ, මහනුවර, මාතර සහ නුවර එළිය හි LGBT පුද්ගලයින්  සිතියම්ගත කිරීම,  ඊකුවල් ග්‍රවුන්ඩ් කොළඹ, ඊකුවල් ග්‍රවුන්ඩ්, 2017.

178 ඉහත සඳහන

179 ඉහත සඳහන, පි 30-21

### *රාජ්‍ය නොවන සංවිධාන, ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී වීම*

LGBTQI+ රාජ්‍ය නොවන සංවිධානවල සහ ඒවායේ මානව හිමිකම් සම්බන්ධ ක්‍රියාකාරීත්වයන්වල ගතිකතාවයන් සහ Queer ව්‍යාපාරය තුළ පවතින ආයතනිකමය දේශපාලන තත්ත්වයන් පිළිබඳ සමීක්ෂණයට ලක්කරන ලද පර්යේෂණ අවධානය යොමු කරයි. ගෝලීය ක්‍රියාකාරී ඉල්ලීම් සමඟ දේශීය දේශපාලන ගතිකතාවයන් සමතුලිත කිරීමට LGBT රාජ්‍ය නොවන සංවිධාන උත්සාහ කරන්නේ කෙසේදැයි තේමාල් එල්ලාවල ඊක්වල් ග්‍රවුන්ඩ් ආයතනයේ මානව හිමිකම් ක්‍රියාකාරීත්වයට අවධානය යොමු කරමින් ප්‍රශ්න කරයි.[180] විෂමජාතීය සම්මතය තුළ සිටින ශ්‍රී ලංකා රජය හා කටයුතු කිරීමේ දී ජනවාර්ගික-ජාතිවාදී සහ පන්ති අතර තිබෙන වෙනස්කම් ආමන්ත්‍රණය කිරීමේ කතිකාවන් සහ බටහිර ආධාරකරුවන් සමඟ කටයුතු කිරීමේ දී Queer අනන්‍යතාවය සම්බන්ධයෙන් ඇති බටහිර දර්ශවාදයන් නැවත නිර්මාණය කිරීම යන දෑ මෙම සංවිධායන විසින් සිදුකරන ආකාරය ඔහු එම අධ්‍යයනයෙන් විස්තර කරයි.[181] මෙම ක්‍රියාවලිය තුළ දී දේශීය Queer අනන්‍යතාවය ඇති පිරිස් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට ලක්වන බව හා මෙම ක්‍රියාවලිය තුළ ඔවුන්ට සමාන්තර හානියක් වන බව ද පෙන්වා දී ඇත.[182]

ජෝෂුවා ආටෙගා ගොන්සාලෙස් විසින් කරන ලද අධ්‍යයනයකින් පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාව තුළ LGBTQ ව්‍යාපාරයේ දේශපාලනය තත්ත්වයන් ප්‍රකාශ වන ආකාරය පිළිබඳව පිළිතුරු සැපයීම සඳහා සමාජ ව්‍යාපාර න්‍යාය සහ පශ්චාත් යටත් විජිත න්‍යාය භාවිත කරයි.[183] ව්‍යාපාරයේ 'දුක්ගැනවිලි' රටේ යටත් විජිත ඉතිහාසයට හා මානව හිමිකම් කතිකාවට සම්බන්ධ වී ඇති බව එය පෙන්වා දේ.[184] ශ්‍රී ලංකාව තුළ ඇති අනන්‍යතාවය, "බටහිර ඇති LGBTQ සංකල්පය" සහ ශ්‍රී ලංකාව තුළ 'LGBTQ ශ්‍රී ලාංකිකයකු වන්නේ කෙසේද' යන කරුණු දෙකේ දෙමුහුන් බවක් ලෙස ගොන්සාලෙස් පෙන්වා දේ. එමෙන්ම බටහිර ඇති "LGBTQ" සංකල්පය අත්‍යවශ්‍ය කිරීම සම්බන්ධයෙන් ඔහු කනස්සල්ල පෙන්වයි.[185] දේශීය ක්‍රියාකාරී උපාය මාර්ග, බටහිර උකහා ගැනීම් අනුකරණය කිරීම පිළිබඳ ක්‍රියාකාරීන්ගේ කනස්සල්ල ද මෙම අධ්‍යයනයෙන් මතු වේ.[186]

'බකමූණෝ' විසින් සිදු කරන ලද LGBTQI+ ක්‍රියාකාරීන් පිළිබඳ අධ්‍යයනයක දී ක්‍රියාකාරීන්ගේ මෙම අවශ්‍යතාවයන් නැවත අවධාරණය කරයි. එය වෙනස් කොට සැලකීම සහ සාපරධීකරණය පිළිබඳ පවතින කරුණු නැවත අවධාරණය කිරීමට අමතරව, ක්‍රියාකාරීන් සහ ක්‍රියාකාරී සංවිධාන අතර පවතින වයස, ස්ථානය සහ දේශපාලන දෘෂ්ටිය මත පදනම් වූ බොහෝ විෂමතා අනාවරණය කරයි.[187] මෙම විෂමතාවන් පිළිබඳව ක්‍රියාකාරීන් අතර පවතින විවිධ මට්ටමේ අවබෝධයන් පිළිබඳ කරුණු මෙම වාර්තාවේ ඇතුළත් වේ. ඊට අනුව සමහර ක්‍රියාකාරීන් එක්සත් පෙරමුණක් අපේක්ෂා කරන අතර තවත් සමහරු ස්වභාවික යැයි පෙනෙන මෙම වෙනස්කම් පිළිගනී.

### *LGBTQI+ පර්යේෂණ පිළිබඳ පසුවිපරම*

ශ්‍රී ලංකාව තුළ LGBTQI+ ගැටලු සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ විශාල ප්‍රමාණයක් නොමැති වුවත්, මෙම වාර්තාවට සමීක්ෂණය කළ පර්යේෂණවලට අනුව පසුගිය වසර 15ක කාලය තුළ මෙම විෂයට පර්යේෂණ විශාල ප්‍රමාණයක් එකතු වී ඇත. මෙම විෂයෙහි ප්‍රමාණය හා විෂයපථය පුළුල් කිරීම සඳහා ඕනෑම LGBTQI+ මාතෘකාවක් පිළිබඳ වැඩිදුර පර්යේෂණ මුළුමනින්ම පිළිගත යුතු ය.

---

180 තේමාල් එල්ලාවල, "ප්‍රචණ්ඩත්වය නීත්‍යානුකූල කිරීම; සමරිසි අයිතිවාසිකම් 'රාජ්‍ය නොවන සංවිධානය සහ ශ්‍රී ලංකාවේ Queer අනන්‍යතාවය විනයානුකූල කිරීම", දකුණු ආසියානු සංවර්ධන සඟරාව 14, අංක. 1 (2019), පි 83-107.
181 ඉහත සඳහන, පි 90-101
182 ඉහත සඳහන, පි 84
183 ජොෂුවා අර්ටෙටා ගොන්සාලෙස්, 'දේදුන්න නැවත පින්තාරු කිරීම, ශ්‍රී ලංකාවේ කොළඹ LGBTQ ව්‍යාපාරයේ දේශපාලනය පිළිබඳ පශ්චාත් යටත් විජිත විශ්ලේෂණයක්', ශුස්තපති නිබන්ධනය, ලූන්ඩ් විශ්ව විද්‍යාලය, 2019
184 ඉහත සඳහන, පි 31-34
185 ඉහත සඳහන, පි 35-38
186 ඉහත සඳහන, පි 38-45
187 බකමූනෝ, ශ්‍රී ලංකාවේ 2010-2017, 2018 දී විවිධ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ අනන්‍යතාව ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් කරන ලදි නිර්දේශ සමාලෝචනය. http://www.bakamoono.lk/admin/wp-content/uploads/2016/06/Review-of-recommendations.pdf

සාමාන්‍ය ලෙස සලකා බලන විට, විශේෂයෙන් හෝ සාපේක්ෂව අඩු නිරීක්ෂණයට ලක් වී ඇති LGBTQI+ ප්‍රජාවේ විවධ අංශ කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන ඕනෑම පර්යේෂණයක් වැදගත් වනු ඇත. අන්තර්ලිංගික ශ්‍රී ලාංකිකයන් පිළිබඳ පවතින පර්යේෂණවල සම්පූර්ණ හිඟයක් පවතින අතර සමරිසි කාන්තවන් හා ද්විරිසි කාන්තා පිරිමි ප්‍රජාවන් ද සාපේක්ෂව ඉතා අඩු වශයෙන් පර්යේෂණවලට ලක් වී ඇත. දැනට පවත්නා පර්යේෂණ මඟින් සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන් සම්පූර්ණයෙන්ම නොසලකා හරිනු නො ලැබුවත්, 'සංක්‍රාන්ති සමාජභාවය' යන පුළුල් පරාසය තුළ තිබෙන 'නච්චි' වැනි අනන්‍යතාවයන් බොහෝවිට මෙම පර්යේෂණවලට ග්‍රහණය නොවේ.

පුළුල් මට්ටමකින් සලකා බලන විට, වර්තමාන පර්යේෂණ සාම්පලවලට අඩු වශයෙන් ග්‍රහණය වී ඇති වෙනත් ජන විකාශන අංශ වඩා හොඳින් ග්‍රහණය කර ගැනීමට උත්සහ කළ යුතු ය. දෙමළ, මුස්ලිම් හෝ වෙනත් සුළු ජාතීන්ට අයත් පුද්ගලයින්; තදාසන්න සහ ග්‍රාමීය ප්‍රදේශවල පුද්ගලයන්; විවධ ආබාධ සමඟ ජීවත්වන පුද්ගලයන්; සහ දැනට ඇති සාම්පලවල සිටින පුද්ගලයන්ට වඩා විශේෂයෙන්ම වයසින් අඩු හෝ වැඩි පුද්ගලයන් මීට ඇතුළත් වේ. මේ සඳහා පර්යේෂණ සැලසුම් කිරීමේ දී සහ සම්පත් ලබා ගැනීමේ දී/යෙදවීමේ දී, විශේෂයෙන් ම භාෂා භාවිතය සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලදි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

මෙම විශ්ලේෂණය මඟින් විශේෂයෙන් හඳුනාගෙන ඇති තේමාවන් තුළ, අනාගත පර්යේෂණ සඳහා යෝජනා ඉදිරිපත් කළ හැකි ය. ප්‍රචණ්ඩත්වය සහ වෙනස් කොට සැලකීම පිළිබඳ සිදුකරන පර්යේෂණ, සමස්තයක් ලෙස ඒවා දෙස බැලීමෙන් ඔබ්බට ගිය පර්යේෂණ වීම අවශ්‍ය වේ. මෙයට ප්‍රජාවේ විශේෂිත කොටස්/අංශයන් කෙරෙහි අවධානය යොමු කිරීම මෙන්ම වෙනස් කොට සැලකීම් සිදුවන නිවාස, අධ්‍යාපනය හෝ රැකියාව වැනි විශේෂිත පරිසර/අවස්ථා සලකා බැලීම ද අවශ්‍ය වේ. එවැනි පර්යේෂණවලදී, LGBTQI+ පුද්ගලයින් වෙනස් කොට සැලකීම්වලට ගොදුරු වූවන් ලෙස පමණක් නොව, රාජ්‍ය හා පෞද්ගලික ආයතන/පුද්ගලයින් වෙනස්කම් කිරීමේ වැරදිකරුවන් ලෙස ග්‍රහණය කර ගැනීමට ද උත්සාහ කළ යුතු ය. නිදසුනක් වශයෙන්, නිවාස ලබා ගැනීම සම්බන්ධයෙන් සිදු වන වෙනස් කොට සැලකීම පිළිබඳ පර්යේෂණ තුළ වින්දිතයන් ලෙස LGBTQI+ පුද්ගලයන් පමණක් නොව, වරදකරුවන් ලෙස රාජ්‍ය නිවාස බලධාරීන්, දේපල නියෝජිතයන් සහ ඉඩම්හිමියන් ග්‍රහණය කළ යුතු ය.

නෛතික තත්ත්වය පිළිබඳ ඇති බොහෝ පර්යේෂණ, දේශීය හා සංසන්දනාත්මක අවධානයකින් යුතු ව සාපරාධීකරණය කෙරෙහි අවධානය යොමු කර ඇත. නමුත් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය LGBTQI+ පුද්ගලයන්ගේ ජීවිතවල සෑම අංශයකටම බලපාන පරිදි වෙනස් කොට සැලකීම ක්‍රියාත්මක කරයි. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන පර්යේෂණ දැනට පවතින නීති විවිධ තත්ත්වයන් පාලනය කරන්නේ කෙසේද සහ ඒවා LGBTQI+ පුද්ගලයන්ට බලපෑම් කරන්නේ කෙසේද යන කරුණු පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

අනන්‍යතාවයන් ගොඩනැඟීම පිළිබඳ ප්‍රශ්නය, පර්යේෂණ සඳහා විශාල මාතෘකා ප්‍රමාණයක් ලබා දේ. ප්‍රජාවේ ගවේෂණයට ලක් නොවූ කොටස්වල අනන්‍යතාවයන් ගොඩනැඟීම අධ්‍යයනය කිරීම පර්යේෂණ සංදර්භය තවත් ශක්තිමත් කිරීමට දායක වනු ඇත. මෙම වාර්තාවේ සාකච්ඡා කළ අනන්‍යතාවයන් ගොඩනැඟීම ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර තිබුණේ බටහිර Queer අනන්‍යතාවය හා බැඳුණු සංකල්ප සහ දේශීය වශයෙන් Queer අනන්‍යතාවය ගැන ඇති අවබෝධය සහ භාවිත අතර ඇති වෙනස්කම් සම්බන්ධයෙනි. මෙම පරතරය තුළ ගවේෂණය කළ හැකි අංශ බොහෝ ඇත. පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන නමුත් සමරිසි පිරිමි ලෙස හඳුනා නොගන්නා පුද්ගලයින් සහ නච්චි පුද්ගලයින් මීට උදාහරණ වේ.

ශ්‍රී ලංකාවේ LGBTQI+ ක්‍රියාකාරීත්වය තවමත් සාපේක්ෂව වර්ධනය වෙමින් පවතී. එම නිසා පැරණි සහ නව සංවිධාන සහ ක්‍රියාකාරීන් පිළිබඳ අධ්‍යයනය කිරීම ඒ සම්බන්ධයෙන් තවදුරටත් තේරුම් ගැනීමට දායක වනු ඇත. මෙම ක්‍රියාකාරීත්වය මර්දනකාරී රාජ්‍ය හා සමාජ සම්මතයන් සහ බටහිර දෘෂ්ටිවාද හා අරමුදල් සම්පාදනයන් අතර දෝලනය වේ. LGBTQI+ ක්‍රියාකාරීන් රාජ්‍ය ආයතන සමඟ, රාජ්‍ය නොවන වෙනත් දේශීය ආයතන/පුද්ගලයන් සමඟ, ජාත්‍යන්තර ආයතන/පුද්ගලයන් සමඟ සහ එකිනෙකා අතර කුමන ආකාරයෙන් ගනුදෙනු කරන්නේ ද යන්න මෙහි දී තවදුරටත් අධ්‍යයනය කළ හැක. මානව අයිතවාසිකම් කේන්ද්‍රයෙන් ඔබ්බට ගොස් පවතින ආර්ථිකමය

ගතිකතාවයන්, ඓතිහාසික හෝ තත්කාලීන යටත්විජිත හෝ නව යටත්විජිත ආර්ථික වැනි මාතෘකා අධ්‍යයනය කිරීම තුළින් මෙම සංදර්භය තවත් පුළුල් කළ හැක.

මෙම වාර්තාව ආවරණය නොකළ අංශ අතරට LGBTQI ප්‍රජාව සම්බන්ධයෙන් ඇති සාහිත්‍ය, චිත්‍රපට, නාට්‍ය සහ වෙනත් දෘශ්‍ය ක්‍රියාකාරකම් වැනි කලා කෘතීන් ඇතුළත් වේ. ඒවා සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ මෙන්ම එම කළා කෘති එකතු කිරීම, විවේචනය සහ විශ්ලේෂණය ඉතා වැදගත් වේ. මෙයට LGBTQI+ තේමාවන් සහ චරිත කෙරෙහි අවධානය යොමු කර ඇති, කුඩා නමුත් වර්ධනය වන මෙවැනි කෘතීන් නිසැකවම ඇතුළත් විය යුතු අතර, පුළුල් සංස්කෘතික නිෂ්පාදනයන් තුළ LGBTQI+ නිරූපණය ද මෙය තුළින් අධ්‍යයනය කළ යුතු ය. එලෙසම, ඓතිහාසික පර්යේෂණ තුළ ශ්‍රී ලංකාවේ LGBTQI අනන්‍යතාවයන් කේන්ද්‍ර කරගත් පර්යේෂණවල සැලකිය යුතු හිඟයක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ පුරාණ, යටත් විජිත හෝ නූතන ඉතිහාසය තුළ තිබුණු Queer අනන්‍යතාවයන් සහ තේමාවන් පිළිබඳ අනාවරණය කර ගැනීමට, ඇගයීමට හා විශ්ලේෂණය කිරීමට බොහෝ දේ ඇත. බොහෝ විට පර්යේෂණ තුළ මේවා පිළිගන්නා නමුත් කලාතුරකින් ගැඹුරින් සාකච්චා කිරීමට භාජනය වේ. එවැනි පර්යේෂණ සහ අධ්‍යයනන් තුළින් LGBTQI+ ශ්‍රී ලාංකිකයින්ට සමාජ, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් ශ්‍රී ලංකාවේ කොටසක් ලෙස වඩාත් ප්‍රබල ලෙස පෙනී සිටීමට උපකාරී වනු ඇත.

Women and Media Collective
Established 1984


**Women and Media Collective**

56/1, Sarasavi Lane, Castle Street,
Colombo 08, Sri Lanka.
Email: wmcsrilanka@womenandmedia.org
Web: womenandmedia.org
Facebook: https://www.facebook.com/womenandmediacollective
Twitter: https://twitter.com/womenandmedia